මගේ අංකය DSD/HO/05/MF/08/චක්‍රලේඛ
எனது இல
My No

ඔබේ අංකය
உமது இல
Your No

දිනය 2025.09. 01
திகதி
Date

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2025/11

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල සභාපතිවරු/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරුවන් වෙත.

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ශ්‍රේණිගත කිරීම හා</u>**
**<u>සමෘද්ධි බැංකු හරසර ඇගයීම් වැඩසටහන - 2025</u>**

**01. හැදින්වීම :-**

දශක තුනකට ආසන්න කාලයක්, දිවයින පුරා සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති ජාලය මගින් ඉලක්ක ගත ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම උදෙසා,ඉතුරුම් ,ණය ,ආයෝජන ඇතුළු අනෙකුත් ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයමින්, ආර්ථික හා සාමාජීය සවිබලකරණ ක්‍රියාවලියේදි විශාල සේවාවක් ඉටු කර ඇත.

ඒ අනුව, සමෘද්ධි බැංකු හා බැංකු සමිති ජාලය හරහා සිදු කරන ලද සමස්ත සේවාවන්හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය මැන බැලීමත්, මෙම කාර්යයන් හි නිරතව දැඩි කැපවීම් සිදු කල නිළධාරීන් ඇගයීම් කිරීමේ අරමුණෙද පෙරදැරිව බැංකු හා බැංකු සමිති ශ්‍රේණි ගත කිරිමේ වැඩසටහන හා බැංකු හරසර ඇගයීම් වැඩසටහන නැවත ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. ඊට අදාල නව චක්‍රලේඛ උපදෙස් හා මග පෙන්වීම් මෙමගින් නිකුත් කරනු ලැබේ.
2019, 2023 වර්ෂ වෙනුවෙන්ද,මෙම වැඩසටහන සම්බන්ධයෙන් චක්‍රලේඛ නිකුත් කලද, පැවති බාහිර සාධක මත අවසාන ඇගයීම් සිදු කිරීමට නොහැකි විය.

ඒ අනුව පෙර වැඩසටහන්හි අත්දැකීම් ද සහිතව මීට අදාල ක්‍රියාකාරකම් අදාල කාල රාමුව තුලම ඉටු කර ගැනීමටද අපේක්ෂා කෙරේ.

**02 ඇගයීම් හා ශ්‍රේණිගත කරනු ලබන ආයතන පද්ධතිය**

I සමෘද්ධි ප්‍රජාමූල බැංකු
II සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති

**03. ශ්‍රේණිගත කිරීම් හා ඇගයීම් වැඩසටහනට ඇතුලත් වීම සඳහා සම්පූර්ණ කළ යුතු සුදුසුකම්**

3.1 **සමෘද්ධි ප්‍රජාමූල බැංකුව**

i. 2021.01.01 දින හෝ ඊට පෙර මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇති බැංකුවක් විම.
ii. සලකා බලන කාලපරිච්ඡේදය තුළ හෝ ඊට පෙර මූල්‍ය වංචාවක්/ මූල්‍ය අක්‍රමිකතාවයක් සිදු වී දැනට විමර්ශණය/ පරීක්ෂණය සිදු වෙමින් පවතින බැංකුවක් නොවිම.

iii. ලබාදුන් ණය මුදලක්/ ණය මුදල්, වෙනුවෙන් වූ බොල් ණය හෝ පැහැර හැරි ණය අය කර ගැනීම සඳහා නව ණයක් නිකුත් කර ණය පියවා ගෙන ඇති විටක, එවනි බැංකු වැඩ සටහනට අදාල කර නොගත යුතුය,

iv. මෙහෙයුම් කටයුතු පරිගණක මෘදුකාංගය (Soft ware) මඟින් සිදුවන බැංකුවක් වීම, එහෙත් සමෘද්ධි බැංකුවේ පාලනයෙන් බැහැර සාධකයන්/ හේතුන් මත පරිගණක මෘදුකාංගයේ කටයුතු පවත්වාගෙන නොයන විටක මෙම සුදුසුකම අතහැර ශ්‍රේණිගත කිරීමේ වැඩසටහනට ඇතුළත් වීමට ඉඩ දෙනු ලැබේ.

### 3.2 සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති

i. 2021.01.01 දින හෝ ඊට පෙර මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇති බැංකු සමිතියක් විම.

ii. සලකා බලන වර්ෂය තුළ හෝ ඊට පෙර වර්ෂයක සිදු වූ මූල්‍ය වංචාවක්/ මුදල් අක්‍රමිකතාවක් පිළිබඳ දැනට විමර්ෂණයක්/ පරීක්ෂණයක් සිදු නොවන ප්‍රජාමූල බැංකු සමිතියක් වීම.

iii. ලබාදුන් ණය මුදලක්/ ණය මුදල්, වෙනුවෙන් වූ බොල් ණය හෝ පැහැර හැරි ණය අය කර ගැනීම සඳහා නව ණයක් නිකුත් කර ණය පියවා ගෙන ඇති විටක, එවනි බැංකු සමිති වැඩ සටහනට අදාල කර නොගත යුතුය,

iv. හඳුන්වා දී ඇති පරිගණක මෘදුකාංගය හරහා මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇති/ මෙහෙයුම් කටයුතු සිදු කරන සමෘද්ධි බැංකු සමිතියක් වීම. නමුත් සමෘද්ධි බැංකු සමිතියේ පාලනයෙන් බැහැර සාධකයක්/ හේතුවක් මත පමණක් පරිගණක මෘදුකාංගයේ කටයුතු පවත්වාගෙන නොයන විටක මෙම සුදුසුකම අතහැර ශ්‍රේණිගත කිරීමේ වැඩසටහනට ඇතුළත් වීමට ඉඩ දෙනු ලැබේ.

## 04. සමෘද්ධි බැංකු /බැංකු සමිති ශ්‍රේණිගත කිරීමට සලකා බලන වර්ෂය හා දත්ත/ තොරතුරු ලබා ගැනීම.

4.1 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ සිදු කරන ලද බැංකු හා බැංකු සමිති මෙහෙයුම් කටයුතු හා ක්‍රියාකාරකම් ශ්‍රේණිගත කිරීමට අදාළ කරගනු ලබයි.විශේෂ ඇගයීම් අවස්ථා සඳහා ඊට පෙර වර්ෂවල දත්තද සලකා බලයි.

4.2 දත්ත හා තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍රයන්

i. පරිගණක මෘදුකාංගයේ ඇති දත්ත/ තොරුතුරු

ii. සමෘද්ධි බැංකුව/ බැංකු සමිති සතු ලෙජර්/ රෙජිස්තර/ ලේඛන

iii. වාර්තා/ ප්‍රකාශන/ ඡායාරූප/ උපහාර සම්මාන/ තිළිණ

iv. පරීක්ෂණ මණ්ඩල නිරීක්ෂණ/ සම්මුඛ පරික්ෂණ මඟින් ලබා ගන්නා තොරතුරු

## 05. ශ්‍රේණිගත කිරීම යටතේ සලකා බලන ක්ෂේත්‍ර/ නිර්ණායක හා ලබා දෙන උපරිම ලකුණු

### 5.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු

| | **ක්ෂේත්‍රය** | **ලබා දෙන උපරිම ලකුණු** |
|---|---|---|
| I. | තැන්පතු | 140 |
| II. | ණය | 150 |
| III. | අවදානම් කළමනාකරණය | 140 |
| IV. | සවිබල කරණය | 130 |
| V. | පරිගණක මෘදුකාංගය ස්ථාපිත කිරීම/ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම. | 50 |
| VI. | වර්ෂය තුළ ලාභ උපයා ගැනීම | 70 |
| VII. | බැංකු අභ්‍යන්තර/ බාහිර පරිසරය සැකසීම හා ගණුදෙනු සත්කාරය | 20 |
| | **මුළු එකතුව** | **700** |

5.2 සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති

| | ක්ෂේත්‍රය | ලබා දෙන උපරිම ලකුණු |
|---|---|---|
| 01 | අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු | 400 |
| 02 | බාහිර මෙහෙයුම් කටයුතු | 300 |
| | **මුළු එකතුව** | **700** |

2013 අංක 01 දරණ සමෘද්ධි පනතෙහි සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වල අරමුණු හා පරමාර්ථයන් දක්වා ඇති අතර, එම අරමුණු හා පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට වැඩසටහන්/ ව්‍යාපෘතීන්/ ක්‍රියාකාරකම් රැසක් සිදු කර ඇත. ඒවා පදනම් කරගෙන බැංකු හා බැංකු සමිති ශ්‍රේණිගත කිරීම හා ඇගයීම සඳහා 2024 වර්ෂයට අදාල ලකුණු ලබා දෙන ක්ෂේත්‍රයන් හඳුනා ගෙන ඇත.

**06. සමෘද්ධි බැංකු සඳහා හඳුනාගත් ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ අනු ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම ,විශ්ලේෂණය කිරීම හා ලකුණු ලබාදීම.**

**6.1** තැන්පතු

ලකුණු ලබාදීමේදී සලකා බලන අනු ක්ෂේත්‍ර හා අදාල කරුණු පහත පරිදි වේ.

i. 2024.12.31 දිනට මුළු ඉතුරුම් ගිණුම් හිමියන් හා තැන්පතු මුදල පදනම් කර ගත යුතුය.

ii. තැන්පතු සඳහා ලකුණු ලබාදීමේදි අදාල සමුච්චිත තැන්පතු මුදල ,තැන්පතු මුදලෙහි වර්ධනය (පසුගිය වර්ෂයට සාපේක්ෂව) ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය (පසුගිය වර්ෂයට සාපේක්ෂව) යන සාධක මත ලකුණු ලබාදීමට තීරණය කර ඇත.

iii. ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය සලකා බැලීමට, අක්‍රිය ගිණුම් සංඛ්‍යාව (Dorman Account) ඇතුළත් කර නොගන්නා අතර , අක්‍රිය ගිණුම්වල තැන්පතු මුදල, තැන්පතු මුදලෙහි වර්ධනය ගණනය කිරීමට ඇතුළත් කෙරේ.

iv. තැන්පතු මුදලෙහි ප්‍රමාණය වර්ධනය ගණනය කිරීමේදි, බැංකු කලාපයට අයත් ග්‍රාම නිලධාරී වසම් ප්‍රමාණය සලකා තැන්පතු මුදලෙහි සාමාන්‍ය ගණනය කරයි. එම ගණනය පහත පරිදි සිදු කළ යුතුය.

$$\text{තැන්පතු මුදලේ සාමාන්‍ය} = \frac{\text{වසර තුල රැස් කරන ලද තැන්පතු මුදල (රු.)}}{\text{බැංකුවට අයත් ග්‍රාම නිලධාරි වසම් ගණන}}$$

v. අනිවාර්ය ඉතිරි කිරීම් හැර පහත සඳහන් ඉතුරුම් ගිණුම් තැන්පතු ගණනයේදි වලංගු වන අතර, එහිදි පහත වර්ගීකරණයට ලක් කළ යුතුය. ඒ සඳහා ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණයන් පහත දැක්වේ.

| තැන්පතු කාණ්ඩය | උපරිම ලකුණු |
|---|---|
| දිගු කාලීන තැන්පතු (කැකුළු, සිසුරක හා ස්ථාවර තැන්පතු.) | 30 |
| දිරිය මාතා හා සාමාජික නොවන තැන්පතු (අනෙකුත් තැන්පතු) | 20 |
| සජීවිකරණ තැන්පතු (සමූහ තැන්පත්) | 40 |
| සාමාජික කොටස් | 45 |
| සාමාජික තැන්පතු | 05 |
| **මුළු එකතුව** | **140** |

6.1.1 ඉතුරුම් තැන්පතු ක්ෂේත්‍රයට අදාළ ගණනය කිරීම් හා ලකුණු ලබා දීම. මුළු ලකුණු 140

| අනුඅංකය | තැන්පතු කාණ්ඩය | ගණනය කරන අයුරු | ලබා දෙන ලකුණු ප්‍රමාණය | උපරිම ලකුණු |
|---|---|---|---|---|
| 01 | **<u>දිගු කාලීන තැන්පතු (කැකුළු/ සිසුරක ස්ථාවර තැන්පතු)</u>**<br>I. මුළු තැන්පතු මුදල ගණනය කිරීම. | මුළු තැන්පතු මුදල (රු.) / රු.මි. 02 | • ලැබෙන අගය රු.මි. 2ක් හෝ ඊට අඩු නම් ලකුණු 1 කි,<br>• ඊට වඩා වැඩි වන සෑම මිලියන 02ට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 20 ක් හිමි වේ.<br>• | 20 |
| | II. මුළු තැන්පතු මුදලට ප්‍රසාද (Bonus) ලකුණු ලබා දිම. | මුළු තැන්පතු මුදල රු.මි. 40 ට වැඩි බැංකු සඳහා ප්‍රසාද ලකුණු (Bonus) ලබා දීම. | 01 | 01 |
| | III. ග්‍රාමනිලධාරි වසමක් වසර තුළ රැස් කරන ලද ඉතුරුම්මුදලෙහි සාමාන්‍ය | වසර තුළ රැස් කරන ලද තැන්පතු මුදල (රු.) / බැංකුවට අයත් ග්‍රාම නිලධාරි වසම් ගණන | • ලැබෙන අගය රු.50,000 හෝ ඊට අඩු නම්, ලකුණු 1 කි,ඊට වැඩිවන, සෑම රු 50,000 ට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 5ක් හිමි වේ.<br>• | 05 |
| | IV. වර්ෂය තුළ නව ගිණුම් සංඛ්‍යාව වර්ධනය | (2024 අවසානයේ තැන්පතු ගිණුම් සංඛ්‍යාව - 2023අවසානයට තැන්පතු ගිණුම් සංඛ්‍යාව) / 2023 අවසානයට තැන්පතු ගිණුම් සංඛ්‍යාව x 100 | • ලැබෙන ප්‍රතිශතය 3.5% හෝ ඊට අඩු නම් ලකුණු 01<br>• ලැබෙන අගය 3.5%ට වැඩි නම් සෑම 3.5% ලකුණු 01 බැගින් හිමි වේ.<br>• | 05 |
| 02 | **දිරියමාතා, හා සාමාජික නොවන තැන්පතු**<br>I. මුළු තැන්පතු මුදල ගණනය කිරීම. | මුළු තැන්පතු මුදල (රු.) / රු.මි. 02 | • ලැබෙන අගය රු. මිලියන 2 හෝ ඊට අඩු නම් ලකුණු 0.5යි.<br>• ලැබෙන අගය, රු. මිලයන 02ට වැඩි වන විට, සෑම මිලියන 02ට ලකුණු 0.5 බැගින් හිමි වේ<br>• | 10 |
| | II. මුළු දිරියමාතා හා සාමාජික නොවන තැන්පතු මුදලට ප්‍රසාද (Bonus) ලකුණු ලබාදිම. | තැන්පතු මුදල රු.මිලියන 40 ට වැඩි නම් ප්‍රසාද (Bonus) ලකුණු ලබාදීම | 01 | 01 |
| | III ග්‍රාම නිලධාරි වසමක වසර තුළ රැස් කරන ලද ඉතුරුම් මුදලෙහි සාමාන්‍යය (රු.) | වසර තුළ රැස් කරන ලද මුළු තැන්පතු මුදල (රු) / බැංකුවට අයත් ග්‍රාම නිලධාරි වසම් ගණන | • බැංකුවක තැන්පතු මුදලෙහි සාමාන්‍ය රු. 100,000 හෝ ඊට අඩු නම් ලකුණු 01 කි.<br>• වසමක සාමාන්‍යතැන්පතු මුදල වැඩි වන සෑම රු.100,000ට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 5 කි,. | 05 |
| | IV ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය | (2024වසර අවසානයේ මුළු ගිණුම් සංඛ්‍යාව - 2023 අවසාන මුළු ගිණුම් සංඛ්‍යාව) / 2023 අවසාන මුල මුළු ගිණුම් සංඛ්‍යාව x 100 | • ලැබෙන අගය 2.5%ක් හෝ ඊට අඩු නම් ලකුණු 01<br>• ලැබෙන අගය වැඩි වන සෑම 2.5% ලකුණු 01 බැගින් | 05 |

| | | | | |
|---|---|---|---|---|
| **3.සජීවීකරණ තැන්පතු (සමූහ තැන්පතු)** | | | | |
| | I. කණ්ඩායම් තැන්පතු මුදල් | මුළු සමූහ තැන්පතු මුදල (රු.) / රුපියල් මිලියන 2 | • ලැබෙන අගය රු.මිලියන 2 හෝ ඊට අඩු නම් ලකුණු 1කි. • ලැබෙන අගය, රු.මිලියන 2ට වැඩි වන සෑම රු.මිලියන 2ට ලකුණු 01 බැගින් | 20 |
| | II. මුළු සමූහ තැන්පත් මුදලට ප්‍රසාද (Bonus) ලකුණු ලබා දිම. | කණ්ඩායම් මුළු තැන්පතු මුදල රු.මි. 41 වඩා වැඩිනම් ප්‍රසාද ලකුණු ලබාදීම. | 01 | 01 |
| | III. ග්‍රාම නිලධාරි වසමක වසර තුළ රැස් කරන ලද ඉතුරුම් මුදලෙහි සාමාන්‍ය (රු.) | වසර තුල රැස් කරන ලද සමූහ තැන්පතු මුදල(රු.) / බැංකුවට අයත් ග්‍රාම නිළධාරි වසම් ගණන | • ග්‍රාම නිලධාරි වසමක තැන්පතු මුදල සාමාන්‍ය.රු.50,000 හෝ ඊට අඩු නම් ලකුණු 2.5 කි. • ඊට වැඩි වන සෑම රු.50,000ට ලකුණු 2.5 බැගින් උපරිම ලකුණු 10 ක් හිමි වේ. | 10 |
| | IV. ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය | (2024 වසර අවසානයේ ගිණුම් සංඛ්‍යාව - 2023 වසර අවසාන ගිණුම් සංඛ්‍යාව) / 2023 වසර අවසාන ගිණුම් සංඛ්‍යාව × 100% | • ලැබෙන අගය 2 % කට් හෝ ඊට අඩු නම් ලකුණු 2.5 කි. • ලැබෙන අගය 2 % ට වැඩි වන විට සෑම 2 % ට ලකුණු 2.5 බැගින් හිමි වේ. | 10 |
| **4. සාමාජික කොටස්** | | | | |
| | I. සාමාජික කොටස් මුදල | මුළු කොටස් මුදල / රු.මිලියන 2 | • රු.මිලියන 2 කට් හෝ ඊට අඩු නම් ලකුණු 1 කි. • රු.මිලියන 2 ට වැඩි වන විට සෑම රු.මිලියන 2 ට ලකුණු 1 බැගින් හිමි වේ. | 25 |
| | II. කොටස් තැන්පතු මුදල මත ප්‍රසාද (Bonus) ලකුණු ලබා දිම. | මුළු සාමාජික කොටස් මුදල රු. මිලියන 47 ට වැඩි නම් ප්‍රසාද ලකුණු ලබා දීම. | 01 | 01 |
| | III. එක් ග්‍රාම නිලධාරි වසමක් වසර තුළ රැස් කරන ලද කොටස් මුදලේ සාමාන්‍ය | වර්ෂය තුල රැස් කරන ලද කොටස් මුදල (රු.) / බැංකුවට අයත් ග්‍රාම නිළධාරි වසම් සංඛ්‍යාව | • රු. 50,000 හෝ ඊට අඩු නම් ලකුණු 2කි. • වැඩි වන විට සෑම රු. 50,000 සඳහා ලකුණු 2 බැගින් උපරිම ලකුණු 10ක් හිමි වේ. | 10 |
| | IV. කොටස් ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය | (2024 වසර අවසානයේ ගිණුම් සංඛ්‍යාව - 2023 වසර අවසාන ගිණුම් සංඛ්‍යාව) / 2023 වසර අවසාන කොටස් ගිණුම් සංඛ්‍යාව × 100% | • වර්ධනය 1 % කට් හෝ ඊට අඩු නම් ලකුණු 1 කි. • වර්ධනය 1 % වැඩි වන සෑම 1% ක සඳහා ලකුණු 1 බැගින් හිමි වේ. | 10 |
| **5.සාමාජික තැන්පතු** | | | | |
| | I. මුළු තැන්පතු මුදල ගණනය (සාමාජික තැන්පතු) | මුළු තැන්පතු මුදල (රු) / රු.මිලියන 06 | • රු.මිලියන 6 කට් ඊට අඩු නම් ලකුණු 0.5කි. • රු.මිලියන 6 වඩා වැඩි වන විට සෑම රු.මිලියන 6 ට ලකුණු 0.5 බැගින් හිමි වේ. | 02 |
| | II. එක් ග්‍රාම නිළධාරි වසමක් වසර තුළ රැස් කරන ලද තැන්පතු මුදලේ සාමාන්‍ය | වසර තුල රැස් කරන ලද තැන්පතු මුදල(රු.) / බැංකුවට අයත් ග්‍රාම නිළධාරි වසම් සංඛ්‍යාව | • ලැබෙන පිළිතුරු රු.50,000 හෝ ඊට අඩු නම් ලකුණු 0.5 කි. • වැඩි වන විට සෑම රු.50,000 ලකුණු 0.5 බැගින් හිමි වේ. | 02 |
| | III. තැන්පතු ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය | (2024 වසර අවසානයේ ගිණුම් සංඛ්‍යාව −2023 වසර අවසාන ගිණුම් සංඛ්‍යාව) / 2023 වසර අවසාන ගිණුම් සංඛ්‍යාව × 100% | • වර්ධනය 3.5% කට් හෝ ඊට අඩු නම් ලකුණු 0.5කි. • වර්ධනය 3.5% ට වැඩි වන විට සෑම 3.5% ට ලකුණු 0.5 බැගින් හිමි වේ. | 01 |

**6.2 ණය මුදා හැරීම හා අය කර ගැනීම.**

සමෘද්ධි බැංකු සාමාජිකයින්ගේ ආයෝජන ශක්තින් උද්දීපනය කරමින් අඩු ආදායම්ලාභී ව්‍යවසායික ප්‍රජාවගේ ආදායම් උත්පාදන කටයුතු සඳහා ප්‍රාග්ධන සම්පාදනය කිරීම සමෘද්ධි බැංකුවේ ප්‍රධාන අපේක්ෂාවයි,

1) කල් පසු වූ හා බොල් ණය රහිත හොඳ ණය කළඹක් පවත්වා ගෙන යාම සමෘද්ධි බැංකු කලමණාකාරිත්වයේ ප්‍රධාන වගකීම වේ.කල් පසු වූ ණය අනුපාත ගණනයේදී අවධානම් ගත ණය කලඹ අනුපාතය සළකා බලයි

2) ණය යනු බැංකුවේ ලාභ ඉපයීමේ ප්‍රධාන වත්කම වේ,සමෘද්ධි බැංකුවේ මෙහෙයුම් වියදම් සඳහා අවශ්‍ය, අරමුදල් අවශ්‍යතා වෙනුවෙන් තිරසාර ණය පොලී ආදායමක් උපයා ගැනීමට කළමණාකාරිත්වය නිරන්තර කටයුතු කළ යුතුය.

3) පිටහිටි ණය ආශ්‍රිත ගණනය කිරීම්වලදී, බොල් ණය ඇත්නම්, එම මුදල් හා ණය සංඛ්‍යාවන් ඉවත් කර ශුද්ධ පිටහිටි ණය මුදල ලබා ගැනීම සිදු කළ යුතුය.

4) ණය මුදා හැරීම යටතේ පහත ගණනය කිරීම් කරනු ලබන අතර, ලබා දෙන උපරිම ලකුණු පහත වගුවේ දැක් වේ.

5) ණය තැන්පතු අනුපාතය ගණනය කිරීමේදී පහත උපදෙස් අනුගමනය කළ යුතුය.

<u>**මුළු තැන්පතු මුදල**</u> = සාමාජික කොටස්, සාමාජික, සාමාජික නොවන, කැකුළු, සිසුරක, දිරිය මාතා, සමුහ, ස්ථාවර තැන්පතු (අනිවාර්ය ඉතුරුම් හැර ගණනය කල යුතුය)

<u>**පිටහිටි ණය මුදල**</u> = පාරිභෝගික, ජීවනෝපාය වක්‍රිය ණය හා ප්‍රතිමූල්‍ය ණය මුදල් යටතේ නිකුත් කළ ණය මුදල ඇතුළත් නොවිය යුතුය.

| | ගණනය කිරීම | ලබා දෙන උපරිම ලකුණු |
|---|---|---|
| i. | පිටහිටි ණය මුදල (බොල් ණය හැර) | 60 |
| ii. | ණය මුදලෙහි වර්ධනය | 10 |
| iii. | ණය සංඛ්‍යාවේ වර්ධනය | 30 |
| iv. | ණය තැන්පතු අනුපාතය (අනිවාර්යය ඉතිරි කිරීම් හැර) | 10 |
| v. | සමෘද්ධි මිතුරු ණය නිකුත් කිරීම | 05 |
| vi. | සමෘද්ධි අරුණළු ණය මුදා හැරීම | 20 |
| vii. | ජීවනෝපාය වක්‍රීය සංවර්ධන වක්‍රීය ණය ලබාදීම හා අරමුදල් භාවිතය | 10 |
| viii. | පාරිභෝගික ණය නිකුත් කිරීම හා සමුහ සංරක්ෂණ අරමුදල භාවිතය | 05 |
| | **එකතුව** | **150** |

6.2.1 ණය මුදා හැරීම ක්ෂේත්‍රයට අදාළ ගණනය කිරීම් හා ලකුණු ලබාදීම මුළු ලකුණු 150

| ගණනය කිරීමට අදාළ ක්ෂේත්‍රයන් | ගණනය තරන අයුරු | ලකුණු ලබා දෙන ආකාරය | උපරිම ලකුණු |
|---|---|---|---|
| i. මුළු පිටහිටි ණය මුදල (බොල්ණය හැර) | මුළු පිටහිටි ණය මුදල (රු.) / රු.මිලියන 15 | • ලැබෙන අගය රු.මිලියන15 ක් හෝ ඊට අඩු නම් ලකුණු 5ක් හිමි වේ.<br>• ලැබෙන අගය වැඩි වන සෑම මිලියන 15ට ලකුණු 5බැගින් ලබා දෙයි. | 60 |
| ii. රු.මි. 180ට වැඩි පිටහිටි ණය මුදල් ඇති විටක ප්‍රසාද ලකුණු (Bonus) ලබා දීම. | මුළු පිටහිටි ණය මුදල රු.මි. 180 වැඩි නම් නම් ප්‍රසාද (Bonus) ලකුණු ලබා දීම | 02 | 02 |
| iii. ණය මුදලේ වර්ධනය | (2024 ,12,31ට මුදාහල සමුච්චිත ණය මුදල - 2023,12,31මුදාහල සමුච්චිත ණය එකතුව (රු.)) / 2023.12.31 දිනට සමුච්චිත මුදා හල ණය මුදල (රු.) ×100% | • වර්ධන ප්‍රතිශතය 10%ක් හෝ ඊට අඩු නම් ලකුණු 2.5 ක් හිමි වේ.<br>• වර්ධන ප්‍රතිශතය 10%ට වැඩිවන, සෑම 10% සඳහාම ලකුණු 2. 5බැගින් හිමි වේ. | 10 |
| iv. ණය සංඛ්‍යාවේ වර්ධනය | 2024 වර්ෂය තුළ මුදාහල නව ණය සංඛ්‍යාවේ එකතුව / 2023.12.31 දිනට සමුච්චිත මුදාහල ණය සංඛ්‍යාව ×100% | • ලැබෙන අගය 3.5% ක් හෝ ඊට අඩු නම් ලකුණු 6 ක් හිමි වේ.<br>• ලැබෙන අගය 3.5% වැඩිවන සෑම 3.5% ටම ලකුණු 6ක් හිමි වේ. | 30 |
| v. ණය තැන්පතු අනුපාතය (අනිවාර්ය ඉතුරුම් රහිත)2024.12.31දිනට | මුළු පිටහිටි ණය මුදල (රු.) / මුළු තැන්පතු (රු) ×100% | • 50≤ණය තැන්පතු අනුපාතය <60 නම් ලකුණු 5<br>• 60≤අනුපාතය<80 නම්,ලකුණු 8 ,<br>• අනුපාතය80 නම් ලකුනු 10<br>• ඊට වැඩි නම් ලකුණු නොමැත. | 10 |
| vi. සමෘද්ධි මිතුරු ණය ක්‍රියාත්මක කිරීම | සමෘද්ධි මිතුරු ණය වැඩසටහන ක්‍රියාත්මක වසම් ගණන / බැංකුවට අයත් ග්‍රාම නිලධාරී වසම් ගණන ×100% | **වසම්=0 නම් ලකුණු -2**<br>**0< වසම් ≤5% නම් ලකුණු 0කි.**<br>**5%< වසම් ≤ 10% නම් ලකුණු 2.5 කි.**<br>**10%< වසම් ≤ 30% නම් ලකුණු 3 කි.**<br>**30%< වසම් ≤ 50% නම් ලකුණු 3.5 කි.**<br>**50%< වසම් ≤ 70% නම් ලකුණු 4 කි.**<br>**70%< වසම් ≤ 90% නම් ලකුණු 4.5 කි**<br>**90%< වසම් නම් ලකුණු 5 කි.** | 05 |
| vii. සමෘද්ධි අරුණළු ණය මුදා හැරීම | සමෘද්ධි අරුණළු ණය ක්‍රියාත්මක පුජා මූල සංවිධාන ගණන / බැංකු බල ප්‍රදේශයට අයත් ප්‍රජාමූල සංවිධාන ගණන × 100% | **ප්‍ර මූ ස% =0 නම් ලකුණු -2කි.**<br>**0< ප්‍ර මූ ස ≤50% නම් ලකුණු 2.5කි.**<br>**50%< ප්‍ර මූ ස ≤ 60% නම් ලකුණු 5 කි.**<br>**60% ප්‍ර මූ ස ≤ 70% නම් ලකුණු 10 කි.**<br>**70%< ප්‍ර මූ ස ≤ 80% නම් ලකුණු15 කි.**<br>**80%< ප්‍ර මූ ස නම් ලකුණු 20කි.** | 20 |
| viii. ජීවනෝපාය වක්‍රිය ණය නිකුත් කිරීම හා වක්‍රිය අරමුදල භාවිතා කිරීම(කේත අංකය 4041) | ජීවනෝපාය වක්‍රිය පිටහිටි ණය මුදල (රු.) / ජීවනෝපාය වක්‍රිය ණය අරමුදල × 100% | **ජීවනෝපාය ණය=0 නම් ලකුණු -2කි.**<br>**0< ණය ප්‍රතිශතය ≤50% නම් ලකුණු 1කි.**<br>**50%< ජීවනෝපාය ණය≤ 60% නම් ලකුණු 2 කි.**<br>**60%< ජීවනෝපාය ණය ≤ 70% නම් ලකුණු 4 කි.**<br>**70%< ජීවනෝපාය ණය ≤ 80% නම් ලකුණු 6 කි.**<br>**80%< ජීවනෝපාය ණය ≤ 90% නම් ලකුණු 8 කි.**<br>**90%<ලබා දුන් ජීවනෝපාය ණය නම් ලකුණු 10 කි.** | 10 |
| ix. පාරිභෝගික ණය සඳහා රඳවා ගත් 60% අරමුදල භාවිතය | පිටහිටි පාරිභෝගික ණය මුදල (රු.) / පාරිභෝගික ණය සඳහා රඳවා ගත් 60% සමූහ සංරක්ෂණ අරමුදල ×100% | **ණය=0 නම් ලකුණු -2කි.**<br>**0< ණය ප්‍රතිශතය ≤50% නම් ලකුණු 1කි.**<br>**50%< ණය≤ 60% නම් ලකුණු 2කි.**<br>**60%< ණය ≤ 70% නම් ලකුණු 3කි.**<br>**70%< ණය ≤ 80% නම් ලකුණු 4කි.**<br>**80%<ලබා දුන්පාරිභෝගික ණය නම් ලකුණු 5 කි.** | 05 |

## 6.3 අවදානම් කලමනාකරණය - ලකුණු 140

මූල්‍ය ස්වයංපෝෂිතභාවය ඇති කිරීම සඳහා බැංකුව තුල ඒ ඒ විෂයට අදාලව අවධානම කලමණාකරණය කර තිබීම අත්‍යාවශ්‍ය වේ.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු මුහුණ දෙන ප්‍රධාන අවධානම් විෂය කේෂ්ත්‍ර 03 කලමනාකරණය කර තිබීම පිළිබද සලකා බලයි.

| අවදානම | ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 1.ණය අවදානම | 50 ( මුළු පිටිහිටි ණය මුදල රු.මිලියන 60 හො ඊට වැඩි විට පමණක් මෙම ලකුණු හිමිවේ.) |
| 2.ද්‍රවශීලතා අවදානම | 10 |
| 3.මෙහෙයුම් අවදානම | 80 |
| **මුළු එකතුව** | **140** |

| අනු අංකය | ක්ෂේත්‍රය | ගණනය කරන අයුරු | ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු |
|---|---|---|---|---|
| **6.3.1** | **ණය අවධානම ලකුණු 50** | | | |
| | I<br>කල් පසු වූ ණය අනුපාතය) | කල්පසුවූ ණය වාරික සහිත ණය වලමුළු පිටහිටි ණය ශේෂය (රු.)<br>——————————X 100%<br>මුළු පිටහිටි ණය මුදල(රු.)<br>(අවධානම්ගත ණය කළඹඅනුපාතය) | කල්පසුවූ ණය ප්‍රතිශතය=0 නම් ලකුණු 30කි.<br>0< කල්පසුවූ ණය ප්‍රතිශතය ≤1% නම් ලකුණු 20කි.<br>1<කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 3% නම් ලකුණු 10 කි.<br>3<කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 5% නම් ලකුණු 5 කි.<br>5<කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 10% නම් ලකුණු 00 කි.<br>10% වැඩි නම් සෑම 1% සඳහා - 1 බැගින් උපරිම - 5කි.(ඍණ) | 30 |
| | ii<br>(අක්‍රිය) බොල් ණය අනුපාතය | පිටහිටි අක්‍රිය(බොල්) ණය මුදල(රු.)<br>——————————X 100%<br>මුළු පිටහිටි ණය මුදල(රු.)<br>පිටහිටි ණය මුදලෙහි අක්‍රිය (බොල් ණය) මුදලද ඇතුළත් විය යුතුය. | බොල් ණය ප්‍රතිශතය=0 නම් ලකුණු 20කි.<br>0<බොල් ණය ප්‍රතිශතය≤ 0.5% නම් ලකුණු 15කි.<br>0.5<බොල් ණය ප්‍රතිශතය ≤1.5% අඩු නම් ලකුණු 10කි.<br>1.5<බොල් ණය ප්‍රතිශතය ≤3%අඩු නම් ලකුණු 5කි.<br>3<බොල් ණය ප්‍රතිශතය ≤5%අඩු නම් ලකුණු 0කි. බොල් ණය 5% වඩා වැඩි වන සෑම 5% ඒකකයක් සඳහාම -2බැගින් උපරිම ලකුණු -10 කි. | 20 |
| | iv<br>සේවකයින් විසින් ණය අක්‍රමිකතා ලෙස ලබා ගැනීම. | බොල් ණය ගිණුම-සේවක අක්‍රමිකතා (කේත අංක 3211) | පලමු රු.50,000/-ක් ශේෂය සඳහා ලකුණු -1 හිමි වන අතර, ඊට පසු සෑම රු.50,000/-ම ලකුණු -1 බැගින් ලබා දීම සිදු කරයි. | (-)ලකුණු |

| | | | | |
|---|---|---|---|---|
| **6.3.2 ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය ලකුණු10** | | | | |
| | I. ද්‍රවශීලතා අනුපාතය ගණනය කිරීම. | ඉතිරි කිරීම් තැන්පතු ගිනුමේ ශේෂය+අත ඉතිරිය+ ජංගම ගිණුම් ශේෂය<br>——————————100%<br>මුළු තැන්පතු | අනුපාතය 10% හෝ ඊට අඩුනම් ලකුණු 10කි.<br>10% වැඩි වන විට සෑම 1% ක් සඳහාම -1බැගින් උපරිම (-5) ලබා දිය යුතුය. | 10 |

| 6.3.3 මෙහෙයුම් අවදානම් කළමනාකරණය ලකුණු 80 | | | | |
|---|---|---|---|---|
| 6.3.3.1 | මෙහෙයුම් කාර්යක්ෂම තාව | 1. වර්ෂය තුළ ලද විගණන විමසුම් සඳහා දින 14ක් තුල පිළිතුරු සැපයීම.<br>2. ණය තැන්පතු හා ආයෝජන ශේෂ පිරික්සුම් තුලන කිරීම.<br>• සියල්ල තුලනය වී ඇත්නම්<br>• 50%-100% අතර තුලනය නොවී ඇත්නම්<br>• 50% ට අඩු නම්<br>3. නිලධාරීන්ට ලිඛිතව විධිමත්ව රාජකාරි පවරා තිබීම.<br>4. සමෘද්ධි බැංකුව සෑම වසරකම ලියාපදිංචි කර තිබීම හා ප්‍රදර්ශණය කර තිබීම.<br>5. පරිගණක මෘදුකාංග සේවා සපයන ආයතන අතර නියමිත පරිදි ගිවිසුම් ගත වී තිබීම.<br>6. අවිනිශ්චිත ගිණුම ණය ගැතියෝ, ණය හිමියෝ හා තුලනය නොවූ අවිනිෂ්චිත ගිණුම් වල ශේෂයන් තිබීම. | ලකුණු 10 පිළිතුරු නොදුන් විගණන විමසුම්වලට (-1) ක් දිය යුතුය.<br>ලකුණු 10<br>ලකුණු 0<br>ලකුණු (-5)<br>ලකුණු 10<br>ලකුණු 05<br>ලකුණු 05<br>ශේෂයක් නැත්නම් - 0 කි<br>ශේෂයක් ඇත්නම් (-5)<br>ලකුණු (-1) | 40 |

**6.3.3.2 කාර්යාල කළමනාකරණය ලකුණු 25**

| කාර්යය | සලකා බලන සාධක | ලබා දෙන උපරිම ලකුණු |
|---|---|---|
| i. විෂය ගොනු යාවත්කාලීන කිරිම. | I. ලිපි ලැබීම් රෙජිස්තර,පැමිණීමේ ලේඛන,නිවාඩු ලේඛන, බැහැර ලේඛන, කෙටි නිවාඩු ලේඛන, ලොග් සටහන් පොත ඇතුළු අභ්‍යන්තර පොත් පත් පවත්වා ගෙන යාම.<br>II. ලිපි ගොනු නාමය හා අංකය සටහන් කිරිම.<br>III. ලිපි ගොනු ක්‍රමානුකූලව අසුරා තිබීම<br>IV. ගොනුවල අධීක්ෂණ නිලධාරි සටහන් වාර්තා තිබීම | එක් කරුණට ලකුණු 2.5 බැගින් උපරිම ලකුණු 10 |
| ii. චක්‍රලේඛ මෙහෙයුම් ගොනු සකස් කිරිම හා යාවත්කාලින කිරිම. | පරිහරණය හා ලබා ගැනිම පහසු වන පරිදි මෙහෙයුම් උපදෙස් හා චක්‍රලේඛ ගොනු සකස් කර තිබිම. | 05 |
| iii. ලිපිගොනු අසුරා තිබිම හා සුරක්ෂිත කිරිම. | ලබා ගැනිම පහසු වන පරිදි ගබඩා කර තිබිම හා ආරක්ෂිතව ගබඩා කිරිම. | 05 |
| IV. මුදල් හා ගිනි ආරක්ෂිත සේප්පු පරිහරණය | මුදල් සේප්පුව ආරක්ෂිත ස්ථානයට තැබිම හා සේප්පු ආරක්ෂා වන පරිදි භාවිතා කර තිබිම. | 05 |

**6.3.3.3.තොරතුරු කලමණාකරණය ලකුණු 15**

| | | |
|---|---|---|
| I. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරිම හා මාසික වාර්තා ඉදිරිපත් කිරිම. | • 2024.12.31 දිනට ගිණුම් පියවිම හා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර තිබිම.<br>• වාර්ෂික හා මාසික ප්‍රගති වාර්තා සකස් කිරිම හා නියමිත දිනට ඉදිරිපත් කිරිම. | 05 |
| II. ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිම. | 2024 වර්ෂයේ නියමිතව සකස් කර ඉදිරිපත් කිරිම, යොමු කිරීම හා ඒ අනුව කටයුතු කර තිබීම. | 05 |
| III. ප්‍රගති සාමාලෝචන රැස්විම් පැවැත්විම. | චක්‍රලේඛ උපදෙස් පරිදි ප්‍රගති රැස්විම් පැවැත්විම.(වාර්තා ලේඛණ සහභාගි ලේඛණ මගින් තහවුරු කිරීම) | 05 |

## 6.4 පවුල් සවිබලකරණය (ලකුණු -130)

පවුල් සවිබල කරණ ක්‍රියාවලියේදි සමෘද්ධි ප්‍රතිලාභින් ආර්ථික හා සාමාජීය වශයෙන් බල ගැන්වීම සඳහා සමෘද්ධි බැංකු විසින් සිදු කරන ලද දායකත්වය සලකා බලයි.ගණනය කිරීම් වලදි ක්ෂේත්‍ර 02 ක් යටතේ මිනුම් කරනු ලබන අතර, ලබා දෙන උපරිම ලකුණු පමාණය 130 කි.

| ක්ෂේත්‍රය | ලබා දෙන උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 6.4.1 ආර්ථික සවිබලකරණය | 100 |
| 6.4.2 සමාජ සවිබලකරණය | 30 |
| **මුළු එකතුව** | **130** |

| සවිබලකරණ ක්ෂේත්‍රය | ගණනය කරන අයුරු | ලබා දෙන ලකුණු ගණනය කිරිම | උපරිම ලකුණු |
|---|---|---|---|
| **ආර්ථික සවිබලකරණය ලකුණු 100** | | | |
| 1. ආදායම් උත්පාදන ව්‍යාපෘති ණය ලබා දීම. | ආදායම් උත්පාදන ව්‍යාපෘතිවලට අදාල පිටහිටි ණය මුදල(රු.) / මුළු පිටහිටි ණයමුදල (රු.) X100% | 40% >ආදායම් උත්පාදන ණය නම් ලක 0<br>40%≤ආදායම් උත්පාදන ණය<60%නම් ලකුණු 5<br>60% ≤ආදායම්උත්පාදනණය<80% නම් ලකුණු 10<br>80% ≤ආදායම්උත්පාදන ණය නම් ලකුණු 15 | 15 |
| 2. ආදායම් උත්පාදන ව්‍යාපෘති ණය සංඛ්‍යාව | ආදායම් උත්පාදන ව්‍යාපෘතිවලට අදාල පිටහිටි ණය සංඛ්‍යාව / මුළු පිටහිටි ණය සංඛ්‍යාව X 100% | 40% > ණය සංඛ්‍යාව නම් 0<br>40% ≤ ණය සංඛ්‍යාව <60%නම් 10<br>60% ≤ ණය සංඛ්‍යාව <70% නම් 20<br>70% ≤ණය සංඛ්‍යාව < 80%නම් 25<br>80% ≤ ණය සංඛ්‍යාව නම් ලකුණු 30 | 30 |
| 3. රන්පත් ලාභි පවුල් සංඛ්‍යාව | 2022 හා2023.ජුනි දක්වා කාලය තුළ සමෘද්ධි සහනාධාර පත්‍ර ආපසු භාර දුන් සංඛ්‍යාව / 2022ආරම්භයේ මුළු සහනාධාරලාභි පවුල් සංඛ්‍යාව X100% | 0% ≤ රන්පත්ලාභී පවුල් <3% ලකුණු 5<br>3% ≤රන්පත්ලාභී පවුල් < 4% ලකුණු 10<br>4% ≤ රන්පත්ලාභී පවුල් < 5%නම් ලකුණු15<br>5% ≤රන්පත්ලාභී පවුල් ලකුණු20 | 20 |
| 4. කොටස් කරුවන්ට ණය මුදල් ලබා දීම. | පිටහිටි ණයකරුවන් සංඛ්‍යාව / කොටස් කරුවන් සංඛ්‍යාව ×100% | පළමු 10% හෝ ඊට අඩු නම් ලකුණු 02<br>10% ට වැඩිවන සෑම 10% සඳහාම ලකුණු 02 බැගින් උපරිම ලකුණු 5 කි. | 10 |
| 5. පවත්වන ලද ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් | වසර තුළ ක්‍රියාත්මක තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | වැඩසටහන් 01කට ලකුණු 01 බැගින් | 05 |
| 6. පැවැත්වූ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් | සති පොළවල්, වෙළඳ ප්‍රදර්ශන, අලෙවි සැල්, අලෙවි පුහුණු වැඩසටහන් සංඛ්‍යාව (ඒකාබද්ධ පැවැත්වූ වැඩසටහන්ද ඇතුළත් කළ හැක.) | වැඩසටහනකට ලකුණු 2 බැගින් ලකුණු 10 | 10 |
| 7. සම්පත් පැතිකඩ සකස් කිරිම | බැංකු කලාපයේ සම්පත් පැතිකඩ වසර 2ක් අඛණ්ඩව සකස් කර යාවත්කාලීනව කිරිම. 2023/2024 | සම්පූර්ණ කරන ලද සම්පත් පැතිකඩ සඳහා ලකුණු 05බැගින් වසර දෙකම | 10 |
| **එකතුව** | | | 100 |

| | | | |
|---|---|---|---|
| 6.4.2සමාජ සවිබලකරණය | ලකුණු 30 | | |
| 1. සමාජ සුභසාධන /සමාජ සත්කාර වැඩසටහන් | සමෘද්ධි බැංකුව මැදිහත් වීම මත නිම කරන ලද නිවාස, වැසිකිළි පානීය ජල, විදුලිය,ග්‍රාමීය මාර්ග හා සිදු කරන ලද සමාජ සුභසාධන /සත්කාර වැඩසටහන් | වැඩසටහනකට ලකුණු 2 බැගින් | 10 |
| 2. සමාජ සංවර්ධන වැඩසටහන් | 2020 සිට 2024 වසර දක්වා ඵලදායිතා, ලේ දන්දීම,වෛද්‍ය සායන, ක්‍රීඩා උත්සව, සංස්කෘතික වැඩසටහන්, ආගමික වැඩසටහන් පැවැත්වීම | එක් වැඩ සටහනකට ලකුණු 2 බැගින් | 10 |
| 3. සමාජ සජීවි කරණ වැඩසටහන් පැවැත්වීම | කුඩා කණ්ඩායම් හා ප්‍රජාමූල සංවිධාන රැස්වීම් පැවැත්වීම,සමාජ සජීවි කරණ වැඩසටහන් | දී ඇති උපදෙස් මත රැස්වීම් හා සාකච්ඡා පවත්වා තිබීම. | 05 |
| 4. සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අනිවාර්ය ඉතුරුම් හා සමාජ ප්‍රතිලාභ ගෙවීම් | දී ඇති උපදෙස් මත2023 හා,2024 වසර තුල පැමිණිලි රහිතව ප්‍රතිලාභ ගෙවා තිබීම. | නිසි පරිදි සිදු කර ඇති විටක ලකුණු 05කි. | 05 |
| **එකතුව** | | | **30** |

**සැ යු.**

ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා ලබා දෙන ණය ලෙස, ජීවනෝපාය සංවර්ධන, ජීවනෝපාය චක්‍රිය ණය, කෘෂිකාර්මික ණය, නව සමෘද්ධි ව්‍යාවසාය සංවර්ධන ණය, හදිසි ව්‍යාපාරික ණය, යොවුන් දිරිය ව්‍යවසායකත්ව ණය, සමෘද්ධි රන්පත ණය යෝජනා ක්‍රම යටතේ ලබාදුන් ණය ඇතුළත් වේ

### 6.5. සමෘද්ධි බැංකු පරිගණක මෘදුකාංග (Software) ස්ථාපිත කිරීම හා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

| විස්තරය | ලකුණු ලබාදීම | උපරිම ලකුණු |
|---|---|---|
| 1. බැංකු කාර්යය මණ්ඩලයට පරිගණක මෘදුකාංගය තුල කටයුතු කිරීමේ හැකියාව | • බාහිර නිරීක්ෂණ යටතේ කාර්යය මණ්ඩල හැකියාව පරීක්ෂා කෙරේ | 30 |
| 2. පරිගණක මෘදුකාංගයට අදාළ උපකරණ හා සම්පත් සපයා ගෙන තිබීම. | පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, පැක්ස්, දුරකථන, අතිරේක අන්තර්ජාල පහසුකම්,(BACKUP) ලකුණු 01 බැගින් • | 05 |
| 3. ලබා දී ඇති උපදෙස් අනුව මුරපද යාවත්කාලීන කිරිම. | චක්‍රලේඛ උපදෙස් මත සිදු කර ඇත්නම් ලකුණු 05 හිමි වේ. | 05 |
| 4. චක්‍රලේඛ උපදෙස් මත මැනුවල් අත් හැරීම | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියාත්මක බැංකු සඳහාඋපරිම ලකුණු හිමි වේ. | 10 |
| **එකතුව** | | **50** |

**6.6 වසර තුළ ලාභ උපයා ගැනිම. ලකුණු 70**

2023.12.31 දිනට උපයාගත් ලාභය පදනම් කරගෙන, අදාළ ගණනය කිරීම හා ලකුණු ලබාදීම සිදු කළ යුතුය.

| නිර්ණායකය | ගණනය කරන අයුරු | ලකුණු ලබාදීම | උපරිම ලකුණු |
|---|---|---|---|
| 1. වාර්ෂික ලාභ ඉපයීම | ශුද්ධ ලාභය (රු.) / මිලියන 4 | • ලාභය රු. මිලියන 4 හෝ ඊට අඩු නම් ලකුණු 02<br>• ලාභය වැඩි සෑම රු. මිලියන 04 ලකුණු 02 බැගින් | 20 |
| 2. ප්‍රසාද ලකුණු ලබා දිම | උපයාගත් මුළු ලාභය | • රු.මි.40 වැඩි ලාභයක් උපයාගෙන ඇත්නම් ප්‍රසාද ලකුණු 1යි. | 01 |
| 3. ආදායම තුල ණය පොලි ආදායම | ණය පොලී ආදායම / මුළු ආදායම ×100% | සෑම 10% සඳහාම, ලකුණු 5 බැගින් හිමි වේ. | 30 |
| 4. වත්කම් මත ගලපන ලද ප්‍රතිලාභ අනුපාතය (AROA) | ශුද්ධ ලාභය / සාමාන්‍ය මුළු වත්කම් X100%<br>වත්කම්වල සාමාන්‍ය නම් වසර මුල හා අග වත්කම් වල එකතුව 02න් බෙදූ විට ලැබෙන පිලිතුර | • ලැබෙන පිලිතුරු. 1% හෝ ඊට අඩු විම ලකුණු 3 කි.<br>• 1% වැඩි වන විට සෑම 0.5 සඳහාම ලකුණු 1 බැගින් හිමි වේ. | 05 |
| 5. කොටසක ඉපැයිම් | ශුද්ධ ලාභය (රු.) / සම්පූර්ණ කල කොටස් සංඛ්‍යාව | • කොටසක ඉපැයීම රු.1000 හෝ ඊට අඩු නම් ලකුණු 2කි.<br>• රු.1000 ට වඩා වැඩිවන සෑම රු. 200/- සඳහා ලකුණු 1 බැගින් හිමි වේ. | 05 |
| 6. මූල්‍ය තිරසාර බව | ශුද්ධ මූල්‍ය වත්කම් / බාහිර වගකීම් X100%<br>බාහිර වගකීම් = තැන්පත් (කොටස් හැර) +ප්‍රතිමූල්‍ය ණය + ගෙවියුතු දෑ<br>ශුද්ධ මූල්‍ය වත්කම් = මුළු වත්කම් - මුළු වගකීම් | • ලැබෙන අගය 20% ක් හෝ ඊට අඩු නම් ලකුණු 1 කි.<br>• 20% ක් හෝ ඊට වැඩි වන විට සෑම 20% සඳහාම ලකුණු 1 බැගින් උපරිම ලකුණු 5ක් හිමි වේ. | 05 |
| 7. කාර්ය මණ්ඩල වියදම් හා මුළු ආදායම අතර අනුපාතය | කාර්ය මණ්ඩල වියදම / වසරේ මුළු ආදායම X100<br>කාර්ය මණ්ඩල වියදම ගණනයේදී කේත අංක 2112,2113,2131 හා 2132 පොදු ලෙජර් අගයන් වල එකතුව වේ. | 40% හෝ ඊට වැඩි නම් ලකුණු 01<br>40% >කාර්යමණ්ඩලවියදම ≥ 30%, ලකුණු 02<br>30% >කාර්යමණ්ඩලවියදම ≥ 20%,ලකුණු 03<br>20 %> කාර්යමණ්ඩලවියදම ≥ 10% ලකුණු 04<br>10% > කාර්යමණ්ඩලවියදම ,ලකුණු 5 | 05 |

## 6.7 සමෘද්ධි බැංකු අභ්‍යන්තර/ බාහිර පරිසරය සැකසීම හා ගණුදෙනු සත්කාරය -මුළු ලකුණු 20

| විස්තරය | උපරිම ලකුණු |
|---|---|
| 1. නාම පුවරු ප්‍රදර්ශනය හා යාවත් කාලීන කිරීම. | 02 |
| 2. බැංකු ගොඩනැගිලි පිරිසිදු කිරීම හා වර්ණ ආලේප කිරීම (චක්‍රලේඛ උපදෙස් මත) | 01 |
| 3. ගොඩනැගිලි නඩත්තුව හා ආරක්ෂණ විධි විධාන (තාප්පය,වැට,ගේට්ටුව,/අවධානම් රහිත ගොඩනැගිල්ලක් තිබීම ආරක්ෂිත දොර ජනෙල්, කොන්ක්‍රීට් ආස්තර කාමරයක් තුල මුදල් සේප්පුව රඳවා තිබීම, විදුලි සීනු/CCTV කැමරා, මුරකරු සේවය/පොලිස් ආරක්ෂාව සඳහා ගෙන ඇති පියවර හා සියළු නඩත්තු සිදු කිරීම.) | 04 |
| 4. ගෙවත්ත පිරිසිදු කිරීම , අලංකරණය හා වගා කර තිබීම. | 03 |
| 5. ගණුදෙනුකරුවන් හා ප්‍රජා නායකයින් සඳහා පහසුකම් ඇති කිරීම. (සභාපති සඳහා කාමර පහසුකම් ලබාදීම, ආසන පහසුකම්, බීම සඳහා ජලය, වැසිකිළි පහසුකම්, පුවත්පත්, රූපවාහිනී යන්ත්‍ර -කරුණකට ලකුණු 1 බැගින්) | 05 |
| 6. අනවශ්‍ය දෑ ඉවත් කර නොතිබීම. (චක්‍රලේඛ උපදෙස් මත) | -05 (සෘණ) |
| 7. මූලික තොරතුරු ප්‍රදර්ශනය, තැන්පතු වර්ග, ණය වර්ග, පොලී අනුපාත හා ණය සීමා ප්‍රදර්ශනය කර තිබීම ප්‍රධාන කාර්යාලීය හා දිස්ත්‍රික් ක්ෂණික ඇමතුම් දුරකථන අංක,ගනුදෙනු කරන වේලාවන්ප්‍රදර්ශනය කර තිබීම | එක් කරුණකට ලකුණු 1 බැගින් මුළු ලකුණු 05 |
| **උපරිම ලකුණු** | **20** |

## 07. සමෘද්ධි බැංකු විසින් නිර්ණායක සඳහා ලකුණු ලබාදීම හා ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම (ඇමුණුම අංක1)

හඳුන්වා දී ඇති ආකෘතීන්ට තොරතුරු ඇතුලත් කිරීම අදාල බැංකු කලමනාකරු විසින් සිදුකල යුතුය. ඇමුණුම අංක 1 මගින් අදාල ආකෘති මේ සමග යොමු කර ඇත. අදාල බැංකුවේ තොරතුරු ඇතුලත් කිරීමේදී බැංකුව අයත් ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු විසින් එම කාර්යය කොටස පිළිබඳව වගකීම දැරිය යුතු අතර නිවරදි ආකාරයට තොරතුරු ඇතුලත් වී ඇත්ද යන්න අධීක්ෂණය කල යුතුය.චක්‍රලේඛය හා ඊට අදාල ආකෘතිපත් දිස්ත්‍රික් ඊමේල් ලිපිනයටද යොමු කර ඇත.

නිවැරදි ආකාරයට තොරතුරු ඇතුලත් නොවූ ආකෘති පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේදී ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු විසින් පහත සඳහන් පියවරයන් අනුගමනය කල යුතුය.

i. අදාළ ආකෘති පත්‍ර බාගත කර ගැනීම (Download)

ii. බැංකු සමිතියට අයත් බැංකු ප්‍රමාණයට සමාන ආකෘති පත්‍ර කට්ටලය බැගින් බැංකු සමිති කළමනාකරු විසින් ලබා ගැනීම (ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමට අදාලව සකස් කර ඇත.)

iii. නියම කරන දිනයකදී, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු විසින් තම අධීක්ෂණය යටතේ ඒ ඒ බැංකු කළමනාකරු මගින් තම බැංකුවට අදාල ආකෘති පත්‍රය සම්පූර්ණ කර ලබා ගැනීම. (අනු අංක 6.1.1හා ඊට අදාල උප අංක , 6.2.1,හා ඊට අදාල ,උප අංක, 6.3.1 ට අදාල උප අංකද ,6.3.2 ,6.3.3.1, 6.3.3.2, 6.4.1.1 හා 6.4.1.2ද 6.4.1.4 හා 6.4.1.5 හා 6.6 හා අදාල උප අංක ඇතුලත් නිර්නායක)

### 7.1 බාහිර නිරීක්ෂණ මත ලකුණු ලබාදීම

අදාල ආකෘතියට තොරතුරු ඇතුලත් කිරීමේදී අනු අංක 6.3.3, හා ඊට අදාල උප අංක,6.4.1.3 ,6.4.1.6,සිට 6.4.1.8, 6.4.2.1හි ඊට අදාල උප අංක, 6.5 හා 6. 7 ට අදාල අනු අංකද ඇතුලත්ව ලකුණු ලබා දීමේදී ලේඛණ ගත තොරතුරුවලට අමතරව, බාහිර නිරීක්ෂණ මත පිහිටා ලකුණු ලබාදීමට සිදුවනු ඇත. තෝරාගන්නා ලද ස්වාධීන කමිටුවක් මගින් අදාල ඇගයීම් සිදුකල යුතු අතර. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බැංකු ඇගයීමේදී බාහිර නිරීක්ෂණ මත ලකුණු ලබාදීම ප්‍රාදේශිය ලේකම් අධීක්ෂණය යටතේ වූ කමිටුවක් මගින් සිදුවිය යුතුය. දිස්ත්‍රික් නියෝජනයක්ද සහිතව 5 දෙනකුගෙන් යුත් කමිටුවක් ප්‍රාදේශිය ලේකම් යටතේ සකස් කලයුතු අතර, ප්‍රාදේශීය කමිටු සංයුතිය පහත පරිදි වේ

**7.2 ප්‍රාදේශීය ඇගයීම් කමිටුව**

i. ප්‍රාදේශිය ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් බලය පැවරූ මාණ්ඩලික නිළධාරීවරයෙකු (සභාපති)
ii. ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු (ලේකම්)
iii. දිස්ත්‍රික් බැංකු විෂය හෝ දිස්ත්‍රික් සමෘද්ධි කළමණාකරුවෙකු (දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විමසා පත් කර ගත යුතුය.)
iv. මූලස්ථාන කළමණාකරු
v. ව්‍යාපෘති කලමණාකරු

දිස්ත්‍රික්කයට අදාලව නිලධාරින් නම් කිරිම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් ද ප්‍රාදේශීය මට්ටමට අදාලව නිලධාරින් නම් කිරිම ප්‍රාදේශිය ලේකම් විසින් ද සිදු කල යුතු අතර එම නම් කිරිම් සියල්ල දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

**7.3 තොරතුරු නිවැරදි බවට නිර්දේශ කිරීම හා ප්‍රතිඵල ලේඛන ඉදිරිපත් කිරීම( ප්‍රාදේශීය මට්ටම)**

බැංකු කළමණාකරු විසින් තම බැංකුවට අදාල ලේඛනගත තොරතුරු ආකෘතියට ඇතුලත් කිරීමෙන් පසුව,අදාල **ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු** විසින් එම තොරතුරුවල සත්‍යතාව පරික්ෂා කර තොරතුරු නිවැරදි බවට අත්සන් තැබිය යුතුය. අනතුරුව බාහිර නිරීක්ෂණ මත ලබා දුන් ලකුණු ඇතුලත් ආකෘතීන්ද අදාල කමිටු නිර්දේශ සමඟ ලබා ගත් සියළු ලකුණු සටහන් පත් **ප්‍රාදේශීය ලේකම් අත්සන් කර** එකම කවරයක බහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.මෘදු (soft coppy) පිටපත ලබාදීමද අනිවාර්ය වේ.

**8. දිස්ත්‍රික් මට්ටම (ඇගයීම් ආකෘති පත් සම්පූර්ණ කිරිම)**

දිස්ත්‍රික් මට්ටමේ තොරතුරු ඇතුළත් කිරීමේ දිස්ත්‍රික් ඇගයීම් ආකෘති පත්‍ර දිස්ත්‍රික් බැංකු විෂය කලමනාකරු විසින් 07 ඡේදයේ සඳහන් පරිදි බාගත (Download) කර ගත හැකිය.
ඒ අනුව ඒ ඒ ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමින් දිස්තික්කය වෙත ඉදිරිපත් කරනු ලබන ඇගයීම් ආකෘති පත්‍ර වල ඇතුලත් තොරතුරු භාවිතා කර දිස්ත්‍රික් ඇගයීම් ආකෘති පත්‍ර සම්පූර්ණ කල යුතු අතර එහි වගකීම දිස්ත්‍රික් බැංකු විෂය කලමණාකරු වෙත පැවරිය යුතුය.
ඒ ඒ බැංකුවට අදාල තොරතුරු ඇතුලත් කිරීමේදී දිස්ත්‍රික් මාසික බැංකු ප්‍රගති වාර්තා සකසනු ලබන බැංකු අනුපිළිවෙලට බැංකුවල නම් ඇතුලත් කිරීමෙන් එම කටයුතු පහසුවන අතර තොරතුරු විශ්ලේෂණය පහසු කරයි. නිවැරදි ආකාරයට තොරතුරු ඇතුළත් නොවූ, අසම්පූර්ණ හා නොගැලපෙන ඇගයීම් ආකෘති පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**8.1 දිස්ත්‍රික් ඇගයීම් කමිටුව**

දිස්ත්‍රික් ඇගයීම් ආකෘති පත්‍රයට තොරතුරු ඇතුළත් කිරීමෙන් පසුව දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/දිස්ත්‍රික් ලේකම් උපදෙස් පරිදි දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ පූර්ණ අධීක්ෂණය යටතේ පහත සඳහන් නිලධාරීන් ගෙන් සමන්විත කමිටුවක් මගින් ප්‍රතිඵල ඇගයීම සිදු කල යුතුය. එම කමිටුව සඳහා පහත නියෝජනයන් සමන්විත විය යුතු වේ.

1. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
2.දිස්ත්‍රික් නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ/ජ්‍යෙෂ්ඨ කළමණාකරු
3.දිස්ත්‍රික් සමෘද්ධි බැංකු විෂය කළමණාකරු
4.අධීක්ෂණ කලමණාකරුවකු
5. දිස්ත්‍රික් සමෘද්ධි කලමණාකරු (ජීවනෝපාය සංවර්ධන)

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමට හා දිස්ත්‍රික් මට්ටමට ප්‍රතිඵල ලේඛන වෙන වෙනම සකස් කල යුතුය. අනතුරුව දිස්ත්‍රික් මට්ටමින් බැංකු ඇගයීම් හා ශ්‍රේණිගත කිරීමේ ප්‍රතිඵල ලේඛනය සකස් කර දිස්ත්‍රික් කමිටු නිර්දේශයන් සහිතව ජාතික මට්ටමේ ඇගයීම් සඳහා දිස්ත්‍රික් ප්‍රතිඵල ලේඛන සමග සියළු ඇගයීම් ආකෘති පත්‍ර දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ අනුමැතියෙන් අත්සන සහිත ව ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත ලබාදීමට කටයුතු කල යුතු වේ,

01. ප්‍රතිඵල ඉදිරිපත් කිරීමේදි පහත දක්වා ඇති කරුණු පිළිබඳව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් පූර්ණ අධික්ෂණයට ලක් කළ යුතුය.

   I. <u>දිස්ත්‍රික්කයේ ඉහලම ලකුණු ලබාගත් බැංකු 10</u>

   II. ඉහත I හි සඳහන් බැංකු 10 " තේරීමේදි දිස්ත්‍රික් කමිටුවේ බාහිර නිරික්ෂණයන්ද ලබාගෙන ලකුණු තහවුරු කර ගැනීම සිදු කල යුතුය.

   III. <u>බැංකු ශ්‍රේණිගත කිරීමට ඉදිරිපත් නොවන සියළුම බැංකු ද "D" කාණ්ඩයට ඇතුළත් කළ යුතුය</u>

02. දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් අදාල ඇගයීම් ප්‍රතිඵල පහත ආකාරයට ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ලබා දීමේදි පහත උපදෙස් අනුගමනය කල යුතුය.

   I. mfbankgrading2022@gmail.com යන විද්‍යුත් ලිපිනයට පමණක් අත්සන සහිතව අදාල දිනට හෝ ඊට පෙර යොමු කිරීම.

   II. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ අත්සන , නිල මුද්‍රාව ,දිනය සහිත සහිත පිටපතක්ද ලබාදීම අනිවාර්යය වේ.

## 09 ලබා ගන්නා ලකුණු මත පදනම්ව බැංකු ශ්‍රේණිගත කිරීම.

| ලකුණු සීමාව | අත් කර ගත් ශ්‍රේණිය | ශ්‍රේණියට අදාල අක්ෂරය |
|---|---|---|
| ලකුණු 525 හෝ ඊට වැඩි | විශිෂ්ඨ | A |
| 525 අඩු 450 හෝ ඊට වැඩි | සතුටුදායක | B |
| 450 අඩු 350 හෝ ඊට වැඩි | සාමාන්‍ය | C |
| 350 අඩු හා බැංකු ශ්‍රේණිගත කිරීමට ඉදිරිපත් නොවූ බැංකු | ඉතා සුවිශේෂ අවධානය ලක් කල යුතු | D |

සලකා බලන කාලය තුල සමස්ථ සමෘද්ධි බැංකු අදාල නිර්ණායක මත ලබා ගනු ලබන ලකුණු අනුව, යම් බැංකුවක් ඊට පහල හෝ ඉහල ශ්‍රේණියකට පත් විය හැකිය. එබැවින් වාර්ෂික ඇගයීම් ක්‍රියාවලියේදි ඊට ඉහල ශ්‍රේණියකට හෝ විශිෂ්ට ශ්‍රේණි ලබා ගත් බැංකු එම මට්ටම පවත්වා ගැනීමට බැංකු කලමණාකාරිත්වය උනන්දු විය යුතුය.

### 9.1 ජාතික මට්ටම

අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ණ අධික්ෂණය යටතේ පත් කරනු ලබන ජාතික ඇගයීම් කමිටුවක ප්‍රධානත්වයෙන් ඇගයීම් කටයුතු සිදුකරනු ලබන අතර ජාතික මට්ටමට ඉදිරිපත් වූ බැංකු අතරින් ඉහලම ලකුණු ලබා ගන්නා බැංකු 10 ජාතික මටටමේදි ඇගයීමට ලක් කරනු ඇත.එසේ ඇගයීමේදි ජාතික මට්ටමේ කේෂ්ත්‍ර නිරික්ෂණයක්ද සිදු කරනු ලැබේ.ඊට අතිරේකව ලකුණු 525 ට වැඩිව ලබා ගන්නා සියලු බැංකු කුසලතා සම්මාන සඳහා තෝරා ගැනේ.

**10 සමෘද්ධි බැංකු හරසර ඇගයීම් වැඩසටහන**

බැංකු ශ්‍රේණිගත කිරීමට සමගාමීව ප්‍රාදේශිය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් එම බැංකු ඇගයීම් ක්‍රියාවලියක්ද ක්‍රියාත්මක කෙරේ.

10.1 ඇගයීම් ක්‍රියාවලිය අවස්ථා 02 ක් යටතේ ඇගයීම් සිදුවේ

- බැංකු ඇගයීම ( බැංකු මට්ටමින්)
- නිලධාරින් හා ප්‍රජා නායකයින් ඇගයීම (බැංකු කාර්යයන්ට ලබා දුන් දායකත්වය මත)

**පහත සඳහන් අවස්ථා යටතේ අදාල ඇගයීම් ක්‍රියාවලිය සිදුකරනු ලැබේ.**

| මට්ටම | ඇගයිමට බැංකු තෝරා ගන්නා අයුරු | තෝරා ගත යුතු බැංකු ගණන (බැංකු මට්ටම) | ඇගයීම්ට ලක් වන නිලධාරින්/ ප්‍රජා නායකයින්/ආයතන |
|---|---|---|---|
| ප්‍රාදේශිය මට්ටම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ශ්‍රේණිගත කිරිම යටතේ ලකුණු 350 ක් හෝ ඊට වැඩි ලකුණු ලබා ගත් බැංකු අතරින් ඉහලම ලකුණු ලබා ගත් බැංකු | 1,2 සහ 3 ලෙස බැංකු 03ක් | I. බැංකු කළමනාකරු<br>II. බැංකු කාර්යය මණ්ඩලය<br>III. ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරින්<br>IV. පාලක මණ්ඩල සභාපති හා සාමාජිකයින් |
| දිස්ත්‍රික් මට්ටම | ලකුණු 450 ක් හෝ ඊට ඉහල ලකුණු ලබා ගත් බැංකු අතරින් ඉහලම ලකුණු ලබා ගත් බැංකු | **දිස්ත්‍රික්කයට අයත් බැංකු ගණන** / **තෝරා ගන්නා ස්ථාන ගණන**<br>60 හෝ ඊට වඩා අඩු — 03<br>61-90 අතර — 05<br>91-120 -අතර — 06 | I. බැංකු කළමනාකරු<br>II. බැංකු කාර්යය මණ්ඩලය<br>III. ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරින්<br>IV. පාලක මණ්ඩල සභාපති හා සාමාජිකයින්<br>V. බැංකු සමිති කළමනාකරු/ කාර්යය මණ්ඩල<br>VI. විධායක කමිටු සභාපති හා සාමාජිකයින්,ප්‍රාදේශීය ලේකම් |
| ජාතික මට්ටම | ඉහල ලකුණු ලබාගත් බැංකු අතරින් හා මුළු ලකුණු 525ට වැඩි ලකුණු ලබා ගත් බැංකු අතරින් | • ලකුණු 525 හෝ ඊට වැඩි දිවයිනේ ඉහලම ලකුණු ලබාගත් බැංකු 10<br>• "A" ශ්‍රේණියට ඇතුලත් වූ සියළු බැංකු කුසලතා සම්මානය සඳහා සුදුසුකම් ලබයි. | I. බැංකු කළමනාකරු<br>II. බැංකු කාර්යය මණ්ඩලය<br>III. ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරින්<br>IV. පාලක මණ්ඩල සභාපති හා සාමාජිකයින්<br>V. ප්‍රාදේශිය ලේකම්<br>VI. බැංකු සමිති කළමනාකරු<br>VII. විධායක කමිටු සභාපති හා සාමාජිකයින්<br>VIII. දිස්ත්‍රික් ලේකම්<br>IX. දිස්ත්‍රික්සමෘද්ධිඅධ්‍යාක්ෂ/දිස්ත්‍රික් නියෝජ්‍ය,/සහකාරඅධ්‍යාක්ෂ/ජ්‍යෙෂ්ඨ කලමණාකරු<br>X. දිස්ත්‍රික් බැංකු විෂය කළමනාකරු/සමෘද්ධි සංවර්ධන නිළධාරි |

| | | | |
|---|---|---|---|
| **අධි ශ්‍රේණි බැංකු** | ලකුණු 560 වැඩි සියළු සමෘද්ධි බැංකු | ලකුණු 560 වැඩි සියළු සමෘද්ධි බැංකු | I බැංකුව, පාලක මණ්ඩලය |
| **ඉහලම ලාභ ඉපයූ බැංකුව** | ආදායම තුල ණය පොලි ආදායම 60% ඉක්ම වූ සමෘද්ධි බැංකු | | සමෘද්ධි බැංකුව,පාලක මණ්ඩලය |
| **වැඩිම "A" ශ්‍රේණි ලබා ගත් දිස්ත්‍රික්කය** | ජාතික ඇගයීම් කමිටුව විසින් තෝරා ගැනේ. (දිස්ත්‍රික් කුසලතා සම්මානය) | | දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,දිස්ත්‍රික් බැංකු විෂය, කලමණාකරු ,සං නිලධාරි, |
| **වැඩිම ක්ෂේත්‍ර මුදල් ඉපයූ සමෘද්ධි සංවර්ධන නිළධාරි** | **කිසිඳු ආකාරයක චෝදනාවට ලක් නොවූ නිලධාරියකු විය යුතුය** | | සමෘද්ධි.ස.නි-තෝරාගත් නිලධාරීන්ව ජාතික මට්ටමින් ඇගයීමට ලක් කළ යුතුය |
| **වැඩිම ණය නිකුත් කල සමෘද්ධි සංවර්ධන නිළධාරියා ඇගයීම** | 1.වසමේ බොල් ණය අනුපාතය 3% අඩු විය යුතුය.<br>2.වසමේ කල් පසුවූ ණය අනුපාතය 05% අඩු විය යුතුය. වසමේ කොටස්කරුවන්ගෙන් 50% වැඩි සාමාජිකයින් සමෘද්ධි බැංකුවෙන් ණය ලබා ගෙන තිබිය යුතුය. (ණයකරු අනුපාතය 50% වැඩි විය යුතුය.) | | තෝරාගත් නිලධාරීන්ව ජාතික මට්ටමින් ඇගයීමට ලක් කළ යුතුය |
| **විශේෂ ඇගයීම** | බැංකු වැඩසටහන තුල නිලධාරි දැක්වූ සුවිශේෂී දායකත්වය ඇගයීම | විශාල වශයෙන් බොල් ණය අය කිරීමට දායක වීම, නව වැඩසටහන් හඳුන්වා දීම, නිර්මාණාත්මක වැඩසටහන් (ඵලදායිතා සමාජ සංවර්ධන) ,සමෘද්ධි බැංකු වැඩසටහන සඳහා සුවිශේෂී දායකත්වය සැපයූ නිළධාරීන් | තෝරා ගන්නා ලද නිලධාරි ජාතික මට්ටමට අගයනු ඇත. |

## 11.සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති ශ්‍රේණිගත කිරීම හා ඇගැයීම.

### 11.1 ශ්‍රේණිගත කිරිම හා ඇගයීම් කිරීමේ අරමුණ

i. බල ප්‍රදේශය තුළ, බැංකු/ බැංකු සමිති කාර්යයභාර්ය වඩාත් කාර්යක්ෂම හා ඵලදායි මට්ටමකට ගෙන ඒම.

ii. බල ප්‍රදේශය තුළ, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ශක්තිමත්ව ගොඩ නැංවිම.

iii. සමෘද්ධි බැංකු සමිති අතර, තරගකාරිත්වය ඇති කර ආයතනික සේවාවන්හි ගුණාත්මකභාවය ඉහල නැංවිම.

iv. ඵලදායි හා කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණය ඇති කිරිම.

v. ඉලක්ක ගත ජනතාව සවිබල ගැන්වීමට පහසුකම් සැලසිම වේගවත් කිරීම.

### 11.2.සමෘද්ධි බැංකු සමිති ඇගයීම හා ශ්‍රේණිගත කිරීම සඳහා නිර්නායක හදුන්වාදීම.

- 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ සමෘද්ධි බැංකු සමිතිවලට අදාළ පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීමේදි සමෘද්ධි බැංකු සමිති සිදු කරන ලද දායකත්වය මිණුම් කිරීම ,ඇගයිම හා ඒ අනුව සමෘද්ධි බැංකු සමිති ශ්‍රේණිගත කිරීම සඳහා නිර්ණායක හදුන්වා දී ඇත.
- ප්‍රධාන ක්ෂේත්‍ර 02ක් හා අනු ක්ෂේත්‍ර 05 යටතේ නිර්ණායක හදුන්වා දෙනු ලැබේ.
- ශ්‍රේණිගත කිරීම් යටතේ, උපරිම ලකුණු 700 ක් ලබා දෙනු ලැබේ.

| ක්ෂේත්‍රයන් | ලකුණු |
|---|---|
| 1. අභ්‍යන්තර මෙහෙයුම් ක්‍රියාවලිය | 400 |
| 2. බාහිර මෙහෙයුම් ක්‍රියාවලිය | 300 |
| **මුළු එකතුව** | **700** |

11.3 නිර්ණායක ගණනය කිරීම හා ලකුණු ලබා දීම.

11.3.1 අභ්‍යන්තර මෙහෙයුම් ක්‍රියාවලිය

අභ්‍යන්තර මෙහෙයුම් ක්‍රියාවලිය අනු ක්ෂේත්‍රයන් 03 යටතේ ලකුණු ලබා දෙයි.

| ක්ෂේත්‍රය | ලබා දෙන ලකුණු |
|---|---|
| I. මූල්‍ය මෙහෙයුම | 100 |
| II. සවිබලකරණය/ සංවර්ධනය | 200 |
| III. අභ්‍යන්තර පරිපාලනය ක්‍රියාවලිය | 100 |
| **එකතුව** | **400** |

11.3.1.1 මූල්‍ය මෙහෙයුම් අංශය යටතේ, පහත පරිදි ගණනය කිරීම් හා ලකුණු ලබා දීම සිදු කරයි.

| දර්ශකය / ක්ෂේත්‍රය | ගණනය කරන අයුරු | ලකුණු ලබාදීම සිදු කරන අයුරු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. **ශ්‍රම ශක්ති ඉතුරුම් තැන්පතු -ලකුණු 07** | | | |
| 1. මුළු ශ්‍රම ශක්ති තැන්පතු මුදල | මුළු තැන්පතු මුදල (රු.) / රු.මි. 1 | • තැන්පතු මුදල රු.1000,000 ට අඩු නම් ලකුණු 01 කි.ඊට වැඩිවන සෑම 1000,000ට ලකුණු 01 බැගින් හිමි වේ. | 04 |
| 2. ශ්‍රම ශක්ති ඉතුරුම් ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය | (වසර අග මුළු ගිණුම් සංඛ්‍යාව - වසර මුල මුළු ගිණුම් සංඛ්‍යාව) / වසර මුල මුළු ගිණුම් සංඛ්‍යාව x100% | • ලැබෙන අගය 2%ට අඩු නම් ලකුණු 01<br>• අගය 2% වැඩි වන විට වැඩි වන සෑම 2% ලකුණු 1 බැගින් හිමි වේ. | 03 |
| **11.3.1.1.2 ) සමෘද්ධි ඉසුරු හා නව සමෘද්ධි ව්‍යවසායකත්ව ණය ලබා දීම ලකුණු 58** | | | |
| 1. මුළු පිටහිටි ණය | මුළු පිටහිටි ණය මුදල (රු) / රු. මි. 2 | • රු.මි. 2 හෝ ඊට අඩු නම් ලකුණු 4<br>• රු.මි. 2 වැඩි වන විට සෑම මි. 02ක් සඳහාම ලකුණු 04 බැගින් හිමි වේ. | 20 |
| 2. ණය මුදලේ වර්ධනය | 2024 වර්ෂය තුළ මුදාහල ණය මුදල (රු.) / 2023.12.31 දිනට මුදාහල සම්මුච්චිත ණය මුදල (රු.) x 100% | • ලැබෙන අගය 10% හෝ ඊට අඩු නම් ලකුණු 2<br>• 10% වැඩි වන සෑම 10%ට ලකුණු 2 බැගින් හිමි වේ. | 8 |
| 3. වර්ෂය තුළ ණය සංඛ්‍යාවේ වර්ධනය | (2024.12.31 ට මුදාහල සමුච්චි ණය සංඛ්‍යාව- 2023 12.31 දිනට සමුච්චිත ණය සංඛ්‍යාව) / 2023.12.31 සම්මුච්චිත ණය සංඛ්‍යාව x 100% | • ලැබෙන අගය 2% හෝ ඊට අඩු නම් ලකුණු 2<br>• ලැබෙන අගය 2%ට වැඩි වන විට සෑම 2% සඳහා ලකුණු 2 බැගින් | 10 |
| (11.3.1.1.3) ණය සංරක්ෂණ අරමුදලේ වන්දි ගෙවීම | • වන්දි ඉල්ලීම් සඳහා උපදෙස් මත සියළු ගෙවීම් කර ඇති විටක | • ලකුණු 10 | 10 |
| (11.3.1.1.4) සමූහ සංරක්ෂණ අරමුදලේ වන්දි ගෙවීම | • වන්දි ලබා දීම නිසි පරිදි සිදු කිරීම. | • ලකුණු 10 | 10 |
| (11.3.1.1.5) අරමුදල් ආයෝජනය ලකුණු 15 | | | |
| i. බැංකු අතිරික්ත මුදල් ආයෝජනය | • බැංකු වලින් මුදල් ලැබී දින 03ක් තුළ ආයෝජන සිදු කිරීම. | • ලකුණු 03 | 15 |
| ii. ආයෝජන නිවේදන බැංකු හරහා ලබා දීම. | • ආයෝජනය කර දින 05 ඇතුළත නිවේදන ලබාදීම | • ලකුණු 03 | |
| iii. අනුමත බැංකුවල නියමිත ප්‍රතිශතයන් යටතේ ආයෝජනය කිරීම. | • ප්‍රසම්පාදන කටයුතුවලට අනුකූලව අනුමත බැංකු හා අනුමත සීමාවන් තුළ ආයෝජන කර තිබේ. | • ලකුණු 03<br>උපදෙස් මත සිදු කර නැත්නම් -(-2)ක් හිමි වේ. | |
| iv. බැංකු සමිති අරමුදල් ආයෝජනය | • දී ඇති උපදෙස් මත සිදු කර ඇති නම් | • ලකුණු 03 | |
| v. ආයෝජන සම්බන්ධ වාර්තා කරණය වාර්තා කිරීම හා ලෙජර්ගත කිරීම. | • දී ඇති උපදෙස් මත සිදු කර තිබේ. | • ලකුණු 03 | |

(11.3.1.1.6) බැංකු සමිතියේ අවදානම් කළමනාකරණය ලකුණු 20

| නිර්ණායකය | ගණනය කරන අයුරු | ලකුණු ලබා දෙන ආකාරය | උපරිම ලකුණු |
|---|---|---|---|
| i. කල් පසුවූ ණය අනුපාතය (සමෘද්ධි ඉසුරු හා නව සමෘද්ධි ව්‍යවසායකත්ව සංවර්ධන ණය ) | කල් පසුවූ ණය වල පිටහිටි ණය මුදල (රු.)<br>———————— x100%<br>අදාළ ණය වල පිටහිටි ණය මුදල (රු.) | කල්පසුවූ ණය ප්‍රතිශතය=0 නම් ලකුණු 10කි.<br>0 < කල්පසුවූ ණය ප්‍රතිශතය ≤1% නම් ලකුණු 8කි.<br>1% <කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 3% නම් ලකුණු 6 කි.<br>3% <කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 5% නම් ලකුණු 4 කි.<br>5% <කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 10% නම් ලකුණු 00 කි<br>වැඩිවන සෑම 10% ඒකකයකට -1 බැගින් උපරිම -5කි | 10 |
| ii. අක්‍රිය ණය(බොල් ණය) අනුපාතය (සමෘද්ධි ඉසුර හා නව සමෘද්ධි ව්‍යවසායකත්ව සංවර්ධන ණය | අක්‍රිය(බොල් )ණය මුදල්වල පිටහිටි ණය මුදල (රු.)<br>———————— *100%<br>අදාළ ණය වල පිටහිටි ණය මුදල (රු.) | බොල් ණය ප්‍රතිශතය=0 නම් ලකුණු 10කි.<br>0<බොල් ණය ප්‍රතිශතය≤ 0.5% නම් ලකුණු 8කි.<br>0.5%<බොල් ණය ප්‍රතිශතය ≤1.5% අඩු නම් ලකුණු 6කි.<br>1.5%<බොල් ණය ප්‍රතිශතය ≤3%අඩු නම් ලකුණු 4කි.<br>3%<බොල් ණය ප්‍රතිශතය ≤5%අඩු නම් ලකුණු 0 කි.<br>බොල් ණය 5% වඩා වැඩි වන සෑම 5% ඒකකයක් සඳහාම -2 බැගින් උපරිම ලකුණු -10 කි. | 10 |
| එකතුව | | | **20** |

11.3.1.2 සවිබලකරණය /සංවර්ධනය (මුළු ලකුණු 200)

ක්ෂේත්‍ර 02 යටතේ පහත පරිදි කාර්යයන් සොයා බලා ලකුණු ලබා දීම සිදු කරයි.

| ක්ෂේත්‍රය | ගණනය කරන අයුරු | ලකුණු ලබා දීම | උපරිම ලකුණු |
|---|---|---|---|
| 11.3.1.2.1 **ආර්ථික සවිබලකරණය 135** | | | |
| I. ආදායම් උත්පාදන ව්‍යාපෘති සංඛ්‍යාව | ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා ලබා දුන් ණය සංඛ්‍යාව<br>———————— X100%<br>මුළු පිටහිටි ණය සංඛ්‍යාව | 50% >ආදායම් උත්පාදන ණය නම් 0<br>50%≤ආදායම් උත්පාදන ණය<60%නම් ලකුණු 5<br>60% ≤ආදායම්උත්පාදනණය<70% නම් ලකුණු10<br>70%≤ආදායම්උත්පාදනණය<80 නම් ලකුණු 20<br>80 හෝ ඊට වැඩි ලකුණු30 | 30 |
| II. සාර්ථක ව්‍යවසායකයින් ගණන | සාර්ථක ව්‍යවසායකයින් සංඛ්‍යාව<br>———————— X100%<br>මුළු ආදායම් උත්පාදන ණය සංඛ්‍යාව | 40% > ණය සංඛ්‍යාව නම් ලකුණු 0<br>40% ≤ ණය සංඛ්‍යාව <60%නම් 30<br>60% ≤ ණය සංඛ්‍යාව <70% නම් 40<br>70% ≤ණය සංඛ්‍යාව < 80%නම් 50<br>80% ≤ ණය සංඛ්‍යාව නම් 60 | 60 |
| III. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන සතිපොළ/ වෙළඳ ප්‍රදර්ශන/ අලෙවි සැල්/අලෙවි පුහුණු වැඩසටහන් | පවත්වන ලද ව්‍යාපෘති/ වැඩසටහන් ගණන | එක් වැඩසටහනකට ලකුණු 05 බැගින් | 25 |
| IV. රජයේ හෝ පෞද්ගලික ආයතන සමඟ ඒකාබද්ධ කළ වැඩසටහන් | පැවැත්වූ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ගණන | වැඩසටහනකට ලකුණු 03 බැගින් | 12 |
| V. ජීවනෝපාය සංවර්ධන පුහුණු/ දැනුවත් කිරීම් වැඩසටහන් | පැවැත්වූ වැඩසටහන් ගණන | වැඩසටහනකට ලකුණු 02 බැගින් | 8 |
| **එකතුව** | | | **135** |

| | | | |
|---|---|---|---|
| **11.3.1.2.2 සමාජ සවිබලකරණය ලකුණු 65** | | | |
| i. සමාජ සංවර්ධන වැඩසටහන් හා සමාජ සත්කාරක වැඩසටහන් | පැවැත්වූ වැඩසටහන් ගණන | එක් වැඩසටහනකට ලකුණු 05 බැගින් | **20** |
| ii. සමෘද්ධි බැංකු සමිති පොදු සුභසාධන අරමුදල් භාවිතය | දියත් කරන ලද ආදායම් උත්පාදන/ සමාජ සංවර්ධන වැඩසටහන් | වැඩසටහනකට ලකුණු 05 බැගින් | **10** |
| iii. සමාජ සජීවිකරණ වැඩසටහන් | කුඩා කණ්ඩායම්/ ප්‍රජාමූල සංවිධාන/ ප්‍රාදේශිය මට්ටම දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටහනකට ලකුණු 05 බැගින් | **35** |
| **මුළු ලකුණු** | | | **200** |

**11.3.1.3 අභ්‍යාන්තර පරිපාලන ක්‍රියාවලිය (මුළු ලකුණු 100)**

**11.3.1.3.1 ආයතන හා පරිපාලන කටයුතු**

සමෘද්ධි බැංකු සමිති ගොඩනැගිල්ල අභ්‍යාන්තර හා බාහිර පරිශ්‍රය, නවීකරණය නඩත්තු කිරිම හා ආයතන හා පරිපාලනය පිළිබඳ පරීක්ෂා කර ලකුණු ලබා දීම සිදු කරයි. මෙම ක්ෂේත්‍රය සඳහා උපරිම ලකුණු 100 ක් හිමි වේ.

| **විස්තරය** | **ලබා දෙන ලකුණු ප්‍රමාණය** |
|---|---|
| **බැංකු පරිශ්‍රය 15** | |
| I. සමෘද්ධි බැංකු සමිති පරිශ්‍රයේ නාම පුවරුව ප්‍රදර්ශණය හා නඩත්තු කිරිම. | 01 |
| II. බැංකු ගොඩනැගිල්ල අනුමත වර්ණ ආලේප කිරිම (වසර තුළ) | 01 |
| III. ගොඩනැගිල්ල නඩත්තුව, ආරක්ෂාව සැපයිම, ආරක්ෂිත ගොඩනැගිල්ලක් විම හා වැට/ තාප්පය මගින් දේපල/ වත්කම් ආරක්ෂා කර තිබිම. | 03 |
| IV. ගෙවත්ත අලංකරණය කිරිම හා වගා කර තිබිම. | 02 |
| V. ගණුදෙනුකරුවන්ට සුහදශිලි පහසුකම් සපයා තිබිම. (ආසන, බීමට ජලය, වැසිකිළි, රූපවාහිනි යන්ත්‍රයක් සවි කර තිබිම, ගොඩනැගිල්ලෙහි සැලසුම ප්‍රදර්ශනය කිරිම) | 05 |
| VI. චක්‍රලේඛ උපදෙස් මත අනවශ්‍යය දෑ ඉවත් කර නොතිබිම. | -01(සෘණ) |
| VII. විධායක කමිටු සභාපති සඳහා පහසුකම් සලසා නොතිබීම | -1(සෘණ) |
| VIII. තොරතුරු ප්‍රදර්ශණය (ණය/ තැන්පත් විස්තර, බැංකු සමිති කාර්යභාරය, සපයන සේවා ආදිය) (එක් කරුණකට ලකුණු 01 බැගින්) | 03 |
| **මෙහෙයුම් කාර්යක්ෂමතාව 25** | |
| I. වර්ෂය තුළ ලද සියළුම විගණන විමසුම්වලට දින 14ක් ඇතුළත පිළිතුරු සපයා තිබිම. | 05 (පිළිතුරු ලබා දි නොමැති විටක -1 ක් හිමි වේ) |
| II. සියළුම ශේෂ පිරික්සුම් තුලනය විම | 04 |
| III.විෂය ලිපි ගොනු ලේඛන යාවත්කාලින කිරිම, හා නඩත්තුව (ලිපි ලැබිම් යැවීම් රෙජිස්තරය, පැමිණිමේ ලේඛන, බැහැර යාමේ ලේඛනය, කෙටි නිවාඩු සටහන් ලේඛනය, ලොග් සටහන් පොත ඇතුළු සියළුම ලේඛන ලකුණු 01 බැගින්) | 08 |
| IV.බැංකු සමිති බල ප්‍රදේශයට අදාල සම්පත් පැතිකඩ සකස් කර තිබීම(වසර 2023,2024) වසරකට ලකුණු 4 බැගින් | 08 |
| තොරතුරු කළමනාකරණය 30 | |
| I .සමෘද්ධි බැංකු හා බැංකු සමිති මූල්‍ය ප්‍රකාශන ඇතුළු මාසික වාර්තා නිසි දිනට ලබා දී තිබිම. | 08 |
| II.පසුවිපරම්/ ප්‍රගති සාමාලෝචන කටයුතු සිදු කිරිම (දී ඇති උපදෙස් මත) | 10 |

| | |
|---|---|
| III.වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කර තිබීම හා යොමු කර තිබීම.ඒ අනුව කටයුතු කිරීම | 12 |

| **සමෘද්ධි බැංකු සමිති පරිගණක ගත කිරීම 30** | |
|---|---|
| I. සියළුම ආයෝජන පිළිබඳ තොරතුරු හා ශේෂ ඇතුළත් කර තිබීම හා මෘදුකාංගය හරහා ආයෝජන කටයුතු සිදු කිරීම (2024.12.31) | 5 |
| II. සියළුම ගිණුම් හිමියන් පිළිබඳ තොරතුරු හා ණය පිළිබඳ ශේෂ ඇතුළත් කර තිබීම. (2024.12.31) | 5 |
| III. පරිගණක මෘදුකාංගය කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සලසා ගෙන තිබීම. (පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, අන්තර්ජාල පහසුකම්,අතිරේක අන්තර්ජාල පහසුකම්(Backup) | 5 |
| IV. දෛනිකව (On date) පරිගණක මෘදුකාංගය හරහා මෙහෙයුම් කටයුතු සිදු කරගෙන යාම | 5 |
| V. බැංකු සමිති කාර්ය මණ්ඩලයට මෘදුකාංගය තුල කටයුතු කිරීමේ හැකියාව | 10 |
| **මුළු ලකුණු** | **30** |

11.3.2 සමෘද්ධි බැංකු සමිතියේ බාහිර මෙහෙයුම් ක්‍රියාවලිය

මෙම ක්ෂේත්‍රය යටතේ පහත පරිදි අනු ක්ෂේත්‍ර 02 යටතේ ලකුණු ලබාදීමට නියමිතය.

| **අනු ක්ෂේත්‍රය** | **උපරිම ලකුණු** |
|---|---|
| 01. මෙහෙයුම්, අධීක්ෂණ හා පසුවිපරම් | 200 |
| 02. අවදානම් කළමනාකරණය | 100 |
| **මුළු එකතුව** | **300** |

11.3.2.1 මෙහෙයුම්, අධීක්ෂණ හා පසුවිපරම් ලකුණු 200

පහත ලකුණු ලබා දීමේදී අදාල බැංකු කලමණාකරු විමසා ලකුණු ලබා දීම කල යුතුය.

| 11.3.2.1.1.සමෘද්ධි බැංකුවල පරිගණක මෘදුකාංගය ස්ථාපිත කිරීම (2024.12.31 දිනට පෙර) | **ලකුණු 65** |
|---|---|
| **විස්තරය** | **ලකුණු** |
| I. සියළුම පිටහිටි ණයකරුවන් පිළිබඳ තොරතුරු හා ශේෂ ඇතුළත් කර තිබීම. | 10 |
| II. සියළුම ගිණුම්කරුවන් පිළිබඳ තොරතුරු හා ශේෂ ඇතුළත් කර තිබීම. | 10 |
| III. පරිගණක මෘදුකාංගයේ ක්‍රියාකාරිත්වයට අවශ්‍ය යටිතල පහසුකම් සපයා ගෙන තිබීම (පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, අන්තර්ජාල පහසුකම්. අතරේක අන්තර්ජාල පහසුකම්.ෆැක්ස්) | 10 |
| IV. ප්‍රමාදයකින් තොරව දිනයට පරිගණක මෘදුකාංගය හරහා මෙහෙයුම් කටයුතු සිදු කිරීම | 15 |
| V. මෘදුකාංගය හරහා මාසික MIS වාර්තා ලබා ගැනීම(ණය.තැන්පතු,පොදු ලෙජර සාරාංශය.බොල්ණය වාර්තාව.කල්පසු වූ ණය වාර්තාව. | 20 |
| **එකතුව** | **65** |

11.3.2.1.2 සමෘද්ධි බැංකු වාර්ෂික ලියාපදිංචි කිරිම. ලකුණු 25

උපදෙස් මත වාර්ෂික ලියාපදිංචිය බැංකු සමිතිය විසින් සිදු කර, ප්‍රදර්ශණය කර තිබිම.
(ලියාපදිංචිය ලබා ගෙන නොමැති විටක ලකුණු (-10) ක් හිමි විය යුතුය.

11.3.2.1.3. මාසික විධායක කමිටු රැස්වීම් පවත්වා තිබිම.මාසික රැස්වීමකට (ල 4 * මාස12) ලකුණු 48

11.3.2.1.4. සමෘද්ධි බැංකු මාසිකව නිරීක්ෂණය කල වාර ගණන
(ලකුණු 12)

| වාර | ලකුණු |
|---|---|
| 1 | 2 |
| 2-3 | 4 |
| 4-5 | 8 |
| 5ට වැඩි නම් | 12 |

11.3.2.1.5 ප්‍රජාමූල සංවිධාන කටයුතු පරික්ෂා කිරිම හා ලකුණු ලබා දිම.

| කාර්යය | ලකුණු |
|---|---|
| I. කාර්යාලයක් පවත්වා ගෙන යාම | 5 |
| II. ඉතිරි කිරිමේ ගිණුම ආරම්භ කිරිම හා අරමුදල් රැස් කර තිබිම. | 5 |
| III. ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම. | 5 |
| IV. සමෘද්ධි අරුණළු ණය වැඩසටහන ක්‍රියාත්මක කිරිම. (අරුණළු ණය ලබා දෙන ප්‍ර .මූ සංවිධාන ගණන/මුළු ප්‍රජා මූ.සංවිධාන ගණන*100) | 5 |
| V. ප්‍රජාමූල සංවිධානයේ වාර්ෂික ලියාපදිංචිය ලබා ගෙන තිබිම. | 5 |
| VI. බාහිර අරමුදල් ලබා ගැනිමට කටයුතු කිරිම. | 5 |
| VII. මාසික රැස්වීම් පැවැත්විම | 5 |
| VIII. කාර්යාල නාම පුවරුවක් තිබිම. | 5 |
| IX. සාමාජිකයින් වෙනුවෙන් ආදායම් උත්පාදන සඳහා වැඩසටහන් පැවැත්විම | 5 |
| X. බාහිර කොන්ත්‍රාත් භාර ගෙන ක්‍රියාත්මක කර තිබිම. | 5 |
| **එකතුව** | **50** |

ඉහත කරුණු සඳහා ලකුණු ලබා දිමේදි ,ඒ ඒ කරුණ සම්බන්ධව 60% ක අවශ්‍යතා සම්පූර්ණ කර තබේ නම් පමණක් ලකුණු ලබා දිය හැකිය.

11.3.2.2 ණය අවධානම් කළමනාකරණය (බල ප්‍රදේශයට අයත් බැංකු සියල්ලේම ණය අවධානම ගණනය කරයි)

| නිර්ණායකය | ගණනය කරන අයුරු | ලකුණු ලබා දෙන අයුරු | උපරිම ලකුණු |
|---|---|---|---|
| I කල් පසුවූ ණය අනුපාතය (සමෘද්ධි බැංකුවල ) | කල් පසුවූ ණය වල පිටහිටි ණය මුදල (රු.) / අදාළ ණය වල පිටහිටි ණය මුදල (රු.) x100 | කල්පසුවූ ණය ප්‍රතිශතය=0 නම් ලකුණු 50කි. 0< කල්පසුවූ ණය ප්‍රතිශතය ≤1% නම් ලකුණු 40 කි. 1<කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 3% නම් ලකුණු 30 කි. 3<කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 5% නම් ලකුණු 20 කි. 5<කල්පසුවූ ණය ප්‍රතිශතය ≤ 10% නම් ලකුණු 00 කි | 50 |
| II අක්‍රිය (බොල්) ණය අනුපාතය (සමෘද්ධි බැංකුවල) | අක්‍රිය (බොල්) ණය මුදල්වල පිටහිටි ණය මුදල (රු.) / අදාළ ණය වල පිටහිටි ණය මුදල (රු.) | බොල් ණය ප්‍රතිශතය=0 නම් ලකුණු 50කි. 0<බොල් ණය ප්‍රතිශතය≤0.5% නම් ලකුණු 40කි. 0.5<බොල් ණය ප්‍රතිශතය ≤1.5% අඩු නම් ලකුණු 30කි. 1.5<බොල් ණය ප්‍රතිශතය ≤3%අඩු නම් ලකුණු 20කි. 3<බොල් ණය ප්‍රතිශතය ≤5%අඩු නම් ලකුණු 0කි. බොල් ණය 5% වඩා වැඩි වන සෑම 5% ඒකකයක් සඳහාම -2බැගින් උපරිම ලකුණු -10 කි | 50 |
| **එකතුව** | | | **100** |

**12. සමෘද්ධි බැංකු සමිති නිර්ණායක සඳහා ලකුණු ලබාදීම හා ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම (ඇමුණුම 2)**

බැංකු සමිති ආකෘති පත් සම්පූර්ණ කිරිමේදි චක්‍රලේඛයේ ඉහත 7 ඡේදයේ සඳහන් පියවරයන් අනුගමනය කල යුතු අතර, ලකුණු ලබාදීම අවස්ථා 02ක යටතේ සිදුවේ. එනම් ලේඛනගත තොරතුරු සඳහා ලකුණු ලබා දීම හා බාහිර නිරීක්ෂණ මත ලකුණු ලබා දීම. ඒ අනුව බැකු සමිති කලමණාකරු විසින් නිර්නායක ඇතුලත් ඇමුණුම 2 ආකෘති පත්‍රයේ පහත සඳහන් අංක යටතේ තොරතුරු ඇතුලත් කල යුතුය.

අභ්‍යන්තර මෙහෙයුම් ක්‍රියාවලිය තුල

- මූල්‍ය මෙහෙයුම යටතේ( ශ්‍රම ශක්ති ඉතුරුම්) අංක 11.3.1.1 ,
- මූල්‍ය මෙහෙයුම යටතේ ( ණය) අංක 11.3.1.1.2
- අවධානම් කළමණාකරණය අංක 11.3.1.1.6
- ආර්ථික සවිබල කරණය(ආදායම් උත්පාදන ව්‍යාපෘති ) අංක 11.3.1.2.1 )
- බාහිර මෙහෙයුම් යටතේ ණය අවධානම් කළමණාකරණය අංක 11.3.2.2

අදාල තොරතුරු ඇතුලත් කර ලකුණු ලබා දීම කල යුතු අතර,නම් කරන ලද දිස්ත්‍රික් කලමණාකරු විසින් එම කටයුතු අධීක්ෂණය කල යුතුය.

**12.1** බාහිර නිරීක්ෂණ මත ලකුණු ලබා දීම

බාහිර නිරීක්ෂණ මත අදාල ආකෘතියට තොරතුරු ඇතුලත් කිරීමේදී,අභ්‍යන්තර මෙහෙයුම් ක්‍රියාවලිය තුල
මූල්‍ය මෙහෙයුම යටතේ , ඉහත ආකෘති පත්‍රයේ ,අංක 11.3.1(1.3),(1.4),(1.5),
ආර්ථික සවිබලකරණය යටතේ,අංක 11.3.1.2(1.2),(1.3) ,(1.4) ,(1.5)
සමාජ සවිබලකරණ යටතේ,අංක 11.3.1.2.2 හි අනු අංක
ආයතන හා පරිපාලන කටයුතු යටතේ,අංක 11.3.1.3.1හි ඊට අදාල අනු අංක,
බාහිර මෙහෙයුම් ක්‍රියාවලිය තුල මෙහෙයුම් අධීක්ෂණ හා පසුවිපරම් යටතේ අංක 11.3.2.1.1 හිණය අදාල අනු අංකද ඇතුලත්ව ලකුණු ලබාදීමේදී බාහිර නිරික්ෂණ මත පිහිටා ලකුණු ලබාදීමට සිදුවනු ඇත. ඉහත බැංකු ඇගයීමේදි නම් කරන ලද දිස්ත්‍රික් ඇගයීම් කමිටුව මගින්ම ප්‍රජාමූල බැංකු සමිති ඇගයීම් සිදුකල යුතු අතර ,ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බැංකු සමිති ඇගයීමේදී බාහිර නිරීක්ෂණ මත ලකුණු ලබාදීම ඉහත කමිටුව මගින් සිදු කිරීමට උපදෙස් ලබා දෙනු ලැබේ.

**12.2** තොරතුරු නිවැරදි බවට නිර්දේශ කිරීම හා ප්‍රතිඵල ලේඛන ඉදිරිපත් කිරීම( ප්‍රාදේශීය මට්ටම)

බැංකු සමිති කළමණාකරු විසින් තම බැංකු සමිතියට අදාල ලේඛනගත තොරතුරු ආකෘතියට ඇතුලත් කිරීමෙන් පසුව,දිස්ත්‍රික් බැංකු විෂය කලමණාකරු හෝ ,ඉහත නම් කරන ලද දිස්ත්‍රික් **කළමණාකරු** විසින් එම තොරතුරුවල සත්‍යතාව පරික්ෂා කර තොරතුරු නිවැරදි බවට අත්සන් තැබිය යුතුය. අනතුරුව බාහිර නිරීක්ෂණ මත ලබා දුන් ලකුණු ඇතුලත් ආකෘතීන්ද අදාල කමිටු නිර්දේශ සමඟ ලබා ගත් සියළු ලකුණු සටහන් පත් අතුළුව ඇගයීම්වලට අදාල විස්තර එකම කවරයක බහා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත භාර දිය යුතුය.මෘදු පිටපත (soft coppy) ලබා දීමද අනිවාර්ය වේ.

**12.3 දිස්ත්‍රික් මට්ටම (ඇගයීම් ආකෘති පත් සම්පූර්ණ කිරීම)**

දිස්ත්‍රික් මට්ටමේ තොරතුරු ඇතුළත් කිරීමේ දිස්ත්‍රික් ඇගයීම් ආකෘති පත්‍ර දිස්ත්‍රික් බැංකු විෂය කලමනාකරු විසින් 07 ඡෙදයේ සඳහන් පරිදි බාගත (Download) කර ගත හැකිය.

ඒ අනුව ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දිස්ත්‍රික්කය වෙත ඉදිරිපත් කරනු ලබන ඇගයීම් ආකෘති පත්‍රවල ඇතුලත් තොරතුරු භාවිතා කර දිස්ත්‍රික් ඇගයීම් ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම දිස්ත්‍රික් සමෘද්ධි බැංකු අංශය මගින් සිදු කල යුතු අතර, එහි වගකීම දිස්ත්‍රික් බැංකු විෂය කලමණාකරු වෙත පැවරිය යුතුය.
ඒ ඒ බැංකු සමිතිවලට අදාල තොරතුරු ඇතුලත් කිරීමේදී දිස්ත්‍රික් මාසික බැංකු සමිති ප්‍රගති වාර්තා සකසනු ලබන බැංකු සමිති අනුපිළිවෙලට බැංකු සමිති වල නම් ඇතුලත් කිරීමෙන් එම කටයුතු පහසුවන අතර තොරතුරු විශ්ලේෂණය පහසු කරයි. නිවැරදි ආකාරයට තොරතුරු ඇතුළත් නොවූ, අසම්පූර්ණ හා නොගැලපෙන ඇගයීම් ආකෘති පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**12.4 දිස්ත්‍රික් ඇගයීම් කමිටුව**

දිස්ත්‍රික් ඇගයීම් ආකෘති පත්‍රයට තොරතුරු ඇතුළත් කිරීමෙන් පසුව දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/දිස්ත්‍රික් ලේකම් උපදෙස් පරිදි දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ පූර්ණ අධීක්ෂණය යටතේ පහත සඳහන් නිලධාරීන් ගෙන් සමන්විත කමිටුව මගින්ම ප්‍රතිඵල ඇගයීම සිදු කල යුතුය.එම කමිටුව සඳහා පහත නියෝජනයන් සමන්විත විය යුතු වේ.

1 දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
2.දිස්ත්‍රික් නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ/ජ්‍යෝෂ්ඨ කලමණාකරු
3.දිස්ත්‍රික් සමෘද්ධි බැංකු විෂය කලමණාකරු
4.අධීක්ෂණ කලමණාකරුවකු
5.නම් කරන ලද වෙනත් දිස්ත්‍රික් කලමණාකරුවකු

සමෘද්ධි බැංකු සමිති මට්ටමට හා දිස්ත්‍රික් මට්ටමට ප්‍රතිඵල ලේඛන වෙන වෙනම සකස් කල යුතුය. අනතුරුව දිස්ත්‍රික් මට්ටමින් බැංකු සමිති ඇගයීම් හා ශ්‍රේණිගත කිරීමේ ප්‍රතිඵල ලේඛනය සකස් කර දිස්ත්‍රික් කමිටු නිර්දේශයන් සහිතව ජාතික මට්ටමේ ඇගයීම් සඳහා දිස්ත්‍රික් ප්‍රතිඵල ලේඛන සමග සියළු ඇගයීම් ආකෘති පත්‍ර දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ අනුමැතියෙන් අත්සන සහිත ව ප්‍රධාන කාර්යාලයේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත පහත සඳහන් ඊමේල් ලිපිනයට පමණක් ලබාදීමට කටයුතු කරන්න.

ඊමේල් ලිපිනය mfbankgrading2022@gmail.com

01.ප්‍රතිඵල ඉදිරිපත් කිරීමේදි පහත දක්වා ඇති කරුණු පිළිබඳව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් පූර්ණ අධීක්ෂණයට ලක් කළ යුතුය.

i. දිස්ත්‍රික්කයේ ඉහලම ලකුණු ලබා ගත් බැංකු සමිති 10
ii. ඉහත I හි සඳහන් බැංකු සමිති 10 තේරීමේදි දිස්ත්‍රික් කමිටුවේ බාහිර නිරීක්ෂණයන්ද ලබාගෙන ලකුණු තහවුරු කර ගැනීම වඩා සුදුසු වේ.
iii. බැංකු සමිති ශ්‍රේණිගත කිරීමට ඉදිරිපත් නොවන සියළුම බැංකු සමිති ද "D" කාණ්ඩයට ඇතුළත් කළ යුතුය

02 .දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ අත්සන සහිත අදාල ඇගයීම් ආකෘති පත්‍ර ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ඉහත විද්‍යුත් ලිපිනයට පමණක් අදාල දිනට හෝ ඊට පෙර යොමු කිරීම.
03.දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ අත්සන හා නිල මුද්‍රාව සහිත පිටපතක්ද ලබාදීම අනිවාර්යය වේ.

**13. සමෘද්ධි බැංකු සමිති ශ්‍රේණිගත කිරිම.**

ඉහත සඳහන් කල ප්‍රධාන අංශ 2ක් හා අනු ක්ෂේත්‍ර 05ක් සඳහා සලකා බලන ලබන නිර්ණායක යටතේ ලබා ගනු ලබන ලකුණු ප්‍රමාණයන් අනුව සමිති ඇගයීම හා ශ්‍රේණි ගත කිරිම සිදුවේ.

එක් එක් බැංකු සමිතිය ලබා ගත් මුළු ලකුණු අනුව පහත ශ්‍රේණි වලට ඇතුළත් කළ යුතුය.

| ලකුණු සීමාව | අත් කර ගත් ශ්‍රේණිය | ශ්‍රේණියට අදාළ අක්ෂරය |
|---|---|---|
| ලකුණු 525 හෝ ඊට වැඩි | විශිෂ්ඨ | A |
| 525ට අඩු 450 හෝ ඊට ට වැඩි | සතුටුදායක | B |
| 450ට අඩු 350 හෝ ඊට වැඩි | සාමාන්‍ය | C |
| 350ට අඩු හා ශ්‍රේණිගත කිරිමට ඇතුළත් නොවු බැංකු සමිති | ඉතා සුවිශේෂී අවධානයට ලක් කළ යුතුය. | D |

දිස්ත්‍රික් කමිටු නිර්දේශ යටතේ ප්‍රතිඵල ලේඛන සකස් කර පෙර සඳහන් පරිදි ජාතික මට්ටමට ප්‍රතිඵල වාර්තා කල යුතුය

**14 බැංකු සමිති ඇගයීම් කිරීම**

| මට්ටම | ඇගැයීමට බැංකු සමිති තෝරා ගන්නා අයුරු | තෝරා ගත යුතු බැංකු සමිති ගණන | ඇගැයීමට ලක්වන නිලධාරින්/ ප්‍රජා නායකයින් |
|---|---|---|---|
| දිස්ත්‍රික් මට්ටම | දිස්ත්‍රික් මට්ටමින් ලකුණු 525 ක් හෝ ඊට වැඩි ලකුණු ලබා ගත් බැංකු සමිති අතරින් ඉහලම බැංකු සමිති සංඛ්‍යාව තෝරා ගනු ලබයි | දිස්ත්‍රික්කය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව අනුව ඇගයීම් ස්ථාන තෝරා ගනු ලබයි.<br><br>ප්‍රා.ලේ කො. 20 හෝ ඊට වැඩිවන විට ස්ථාන 5<br>ප්‍රා ලේ කො 19-16 අතර ස්ථාන 4<br>ප්‍රා ලේ කො 15-1 අතර ස්ථාන 3 | I. බැංකු සමිති කළමනාකරු<br>II. බැංකු සමිති කාර්යය මණ්ඩලය<br>III. විධායක කමිටු සභාපති ඇතුළු සාමාජිකයින්<br>IV. ප්‍රාදේශීය ලේකම් |
| ජාතික මට්ටම | • දිවයිනේ ඉහලම ලකුණු ලබා ගත් බැංකු සමිති<br>• A ශ්‍රේණියට ඇතුළත් වන සියළුම බැංකු සමිති කුසලතා සම්මාන සඳහා තෝරා පත් වේ. | i. ඉහලම ලකුණු ලබා ගත් බැංකු සමිති 10<br>ii. A ශ්‍රේණියට ඇතුළත් වන සියළුම බැංකු සමිති කුසලතා සම්මාන සඳහා සුදුසුකම් ලබයි. | I. බැංකු සමිති කළමනාකරු<br>II. බැංකු සමිති කාර්යය මණ්ඩලය<br>III. විධායක කමිටු සභාපති ඇතුළු සාමාජිකයින්<br>IV. දිස්ත්‍රික් බැංකු විෂය කළමනාකරු<br>V. ප්‍රාදේශිය ලේකම්<br>VI. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ<br>VII. දිස්ත්‍රික් ලේකම් |

**15. ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කලයුතු කාල පරාසය**

2025.09.01 දින සිට 2025.09.22 අතර කාල රාමුවක් ඉදිරිපත් කෙරේ. (ඇමුණුම අංක 03 )

**16. ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය**

ඇගයීමට ලක් වන බැංකු, බැංකු සමිති හා ඊට අදාල නිලධාරින් වෙනුවෙන් පිරිනමනු ලබන ත්‍යාග හා සහතික පත් පිරිනැමීම සම්බන්ධයෙන් ඉදිරියේදී දැනුවත් කෙරේ. අමාත්‍යාංශ ලේකම් හා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය විසින් සංවිධානය කරනු ලබන ගරු විෂයභාර අමාත්‍යවරයා නියම කරනු ලබන දිනයකදී අතිගරු ජනාධිපතිතුමා, ගරු විෂයභාර අමාත්‍යතුමා, ප්‍රධානත්වයෙන් යුත් ජාතික උත්සවයකදී සිදුකරනු ලබයි.

**17. පොදු කරුණු**

17.1 මෙම අභිප්‍රේරණ ක්‍රියාවලිය වඩාත් සර්වසාධාරණ ස්වාධින එකක් විය යුතු අතර, අදාල රාජකාරි පැවරෙන නිලධාරින් එය නිවැරදිව ක්‍රියාත්මක කල යුතු වේ.

17.2 අදාල ඇමුණුම් මගින් සියළු මහපෙන්වීම් සිදුකර ඇති අතර, අදාල උපදෙස් මනාව අවබෝධ කර කාර්යය ඉටු කර දිය යුතු අතර, අදාල කාල රාමුව තුල කාර්යයන් ඉටු කල යුතු වේ.

17.3 පත්කරන ලද ඇගයීම් කමිටු මණ්ඩල සාමාජිකයන් පවරනු ලබන රාජකාරි කොටස් සාධාරන අපක්ෂපාති හා නිවැරදිව ඉටු කර දීම වගකීම වනු ඇත..

මෙම අභිප්‍රේරණ ක්‍රමවේදය පියවරෙන් පියවර වැඩි දියුණු කරමින් ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කරන අතර සෑම වසරකම ඇගයීම් ක්‍රමවේදය අඛණ්ඩව සිදුකිරීමට අපේක්ෂා කෙරේ. මෙහි සඳහන් කරුණු සම්බන්ධව කිසියම් ගැටළුවක් හෝ පැහැදිලි කිරීමක් හෝ වේ නම් පහත දුරකථන අංකය අමතන මෙන් වැඩි දුරටත් දන්වා සිටිමි.

**071 0921148 - විෂය කළමනාකරු - ඩබ්.රුක්මා මානෙල්**

සී.ඩී.කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

1. ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ,ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - දැ.ගැ.ස.හා අ.ක.ස.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ගැ.ස.හා අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
7. සභාපති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය - දැ.ගැ.ස.